ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2025

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 12.2 ඡේදයට අනුව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරන ලදී.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

විභාග කොමසාරිස් ජනරාල්ගේ පණිවුඩය

ලෝකයේ තාක්ෂණික දියුණුවත් සමඟ තොරතුරු තාක්ෂණය, සන්නිවේදනය ප්‍රමුඛ කරගත් ක්ෂේත්‍ර සීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතී. ඒ ඔස්සේ වත්මන් සිසු පරපුර මත නව අභියෝග රැසක් නිර්මාණය වී ඇත. නව තාක්ෂණික දැනුම සහ බුද්ධිය කේන්ද්‍ර කර ගත් සමාජයක කාලීනව වෙනස් වන රැකියා අවස්ථා සඳහාත් අභියෝග ජය ගැනීම සඳහාත් සුදුසු සිසු පරපුරක් බිහි කිරීමේ අවශ්‍යතාවක් ඇත. එය සඵල කර ගැනීම සඳහා සංවේදී මනසකින් යුතු, උසස් චින්තන හැකියාවෙන් සහ නිරෝගී ගුණගරුක පරපුරක් බිහිකිරීම, පාසල් අධ්‍යාපනයේ අරමුණයි. ඒ උදෙසා අධ්‍යාපන පද්ධතිය තුළ, කටයුතු කරනු ලබන ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි.

එවන් වූ අරමුණු ඉටු කර ගැනීම උදෙසා, අභියෝගාත්මක කාල පරිච්ඡේදයන්ට හා අභියෝග පෙර දකිමින්, ඒ සඳහා පෙර සූදානම්ව සිටීම තුළින් දැයේ දරුවන්ගේ අපේක්ෂා මුදුන්පත් කරලීමට හැකි ප්‍රශස්ත විභාග ක්‍රියාවලියක් සැලසුම් කළ අතර එසේ සැළසුම් කළ කාල පරිච්ඡේදය තුළම විභාග පවත්වන්නට හැකි වීම විභාග දෙපාර්තමේන්තුව සතු දුරදර්ශී ප්‍රතිපත්තිමය ස්ථායිතාව කදිමට පසක් කරයි.

රාජ්‍ය සේවයේ සියලු කටයුතු ඩිජිටල්කරණය වෙමින් පවතින යුගයක ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රියාවලිය ද ඩිජිටල්කරණය කිරීමට පියවර ගැනීම තුළින් වඩාත් සාර්ථක හා ප්‍රශස්ත ඇගයුම් හා තක්සේරුකරණ ක්‍රියාවලියක නිරත වීමට ද වර්තමානය වන විට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවට හැකියාව ලැබී ඇත.

ශ්‍රී ලාංකීය මතු පරපුරේ අධ්‍යාපන මට්ටම නිවැරදිව ඇගයීමකට ලක් කරන ජාතික මට්ටමේ ප්‍රමුඛතම අයතනය ලෙස, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රියාවලිය මගින් ජාතික මට්ටමේ විභාගයන්හි ප්‍රමිතිය, විනිවිදභාවය, නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය ඉහළම මට්ටමින් සුරක්ෂිත කිරීමට ඇප කැප වී සිටී.

ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ
විභාග කොමසාරිස් ජනරාල්

දැක්ම

ඇගයීම් ක්‍රමවේද සහ භාවිත විශිෂ්ට ලෙස යොදා ගනිමින් ද වෙනත් විවිධ පරීක්ෂණ කාර්යයන් හැසිරවීම තුළින් ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා නායකත්වය සැපයීම

මෙහෙවර

ජාතික අවශ්‍යතාවලට ගැළපෙන සේ විශ්වසනීයතාව හා වලංගුතාව ආරක්ෂා වන පරිදි සකස් කරනු ලබන ඇගයීම් උපකරණ හා ක්‍රම ශිල්ප මඟින් අධ්‍යාපනික සාධනය හා සහතිකකරණය පිළිබඳ ක්‍රියාකාරකම් විශිෂ්ටත්වය කරා මෙහෙයවීම

හැඳින්වීම

රටක ආර්ථික, සංස්කෘතික හා තාක්ෂණික සංවර්ධනය උදෙසා මෙන්ම එක් එක් පුද්ගලයාගේ මනෝභාව, දැනුම සහ කුසලතා වර්ධනය කර ගැනීම උදෙසා ද අධ්‍යාපනය මගින් සිදුවන කාර්යභාරය අතිමහත් වන අතර, මේ සඳහා ඉතා වැදගත් භූමිකාවක් ඉටු කරන ආයතනයක් ලෙස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හැඳින්විය හැකිය.

1951 වර්ෂයේ සිට දශක අටකට ආසන්න කාලයක් තිස්සේ අධ්‍යාපන පද්ධතියේ මූලික සාධකයක් වශයෙන් කටයුතු කරන මෙම දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකාවේ පාසල් විභාග සියල්ලමත් ආයතනික විභාග අතිමහත් බහුතරයකුත් රහස්‍යභාවය ආරක්ෂා කරගනිමින් නියාමනය කරනු ලබයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඔස්සේ යාවත්කාලීන වෙමින් ප්‍රශ්න පත්‍රවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමත්, නවීන තාක්ෂණික ප්‍රවණතා අනුගමනය කරමින් විභාග පද්ධතිය හැඩගැස්වීමත් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අභිප්‍රාය වේ.

අධ්‍යාපන නවීකරණයන්ට ගැළපෙන ලෙස ජාතික විභාග පැවැත්වීමට මෙන්ම, නවීන තාක්ෂණික ක්‍රමවේද ඔස්සේ විභාග ප්‍රතිඵල ලබාදීම, සහතික පත්‍ර නිකුත් කිරීම ඇතුලු කාර්යක්ෂම සේවාවක් සැපයීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවට හැකියාව ලැබී ඇත. එමෙන්ම විශ්වසනීයත්වය, සාධාරණත්වය, සාමූහිකත්වය සහ අපක්ෂපාතීත්වය අරමුණු කරගත් විභාග ක්‍රියාවලිය තුළින් නිරවද්‍යතාවයෙන් යුතුව සිසු හැකියාවන් ඇගයීමට හා තක්සේරුකරණයට හැකිවීම ද ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාවක් ලෙස විභාග දෙපාර්තමේන්තුව සතු සුවිශේෂී ලක්ෂණයකි.

මෙම වාර්තාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2025 වර්ෂය තුළ සිදුකරන ලද කාර්යභාරය පසුවිපරම් කරමින් එහි ප්‍රගතිය ඉදිරිපත් කිරීම උදෙසා සම්පාදනය කර ඇත.

පටුන

විභාග කොමසාරිස් ජනරාල්ගේ පණිවුඩය i
දැක්ම ii
මෙහෙවර ii
හැඳින්වීම iii
1. විභාග දෙපාර්තමේන්තුවේ කාර්යභාරය 1
2. විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන 3
3. විභාග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ශාඛා 4
4. විභාග දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය හා ඉදිරි දැක්ම 5
4.1 ලබාගත්තා ලද විශේෂ ජයග්‍රහණ හා මුහුණ දුන් අභියෝග 5
4.2 2026 වර්ෂය සඳහා සැලසුම් කර ඇති වැඩසටහන් 7
5. 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය 9
5.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 10
5.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 11
5.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 12
5.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 17
5.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 17
5.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 18
5.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 19
5.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 20
6. ආයතනයේ කාර්ය සාධන දර්ශක 43
(ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 43
7. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 44
7.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 46
8. මානව සම්පත් පැතිකඩ 47
8.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 47
8.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය 47
8.3 මානව සම්පත් සංවර්ධනය 48
9. අනුකූලතා වාර්තාව 50

1. විභාග දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත මගින් 1951 වර්ෂයේ දී පිහිටුවන ලද ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ප්‍රසිද්ධ විභාග පැවැත්වීම සම්බන්ධව නෛතික බලතල සහිත එකම රාජ්‍ය ආයතනය වේ. මෙහි කාර්යභාරය පහත පරිදි වේ.

01. ඇගයීම් හා පරීක්ෂණ කාර්යය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වන අතර, වර්තමානය වන විට වර්ෂයකට විභාග 300කට අධික ප්‍රමාණයක් පැවැත්වීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි.

02. අ.පො.ස. (සාමාන්‍ය පෙළ), අ.පො.ස. (උසස් පෙළ), 5 ශ්‍රේණි ශිෂ්‍යත්ව විභාගය සහ සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය යනාදී පාසල් විභාග සඳහා සැලසුම් සකස් කිරීම, ප්‍රශ්න පත්‍රවල ව්‍යුහය තීරණය කිරීම හා සැකසීම, විභාග සංවිධානය කිරීම හා පැවැත්වීම, ඇගයීම් කටයුතු සිදු කිරීම හා ප්‍රතිඵල නිකුත් කිරීම.

03. රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල බඳවා ගැනීම්, උසස් කිරීම්, කාර්යක්ෂමතා කඩඉම්, වාචික පරීක්ෂණ යනාදී වෙනත් විභාගයන් ද මෙම දෙපාර්තමේන්තුව මගින් පැවැත්වේ. එම විභාගයන්හි ස්වභාවය අනුව, ප්‍රශ්න පත්‍රවල ව්‍යුහය තීරණය කිරීම හා සැකසීම, විභාග සංවිධානය කිරීම හා පැවැත්වීම, ඇගයීම් කටයුතු සිදු කිරීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සිදු කරයි.

04. දේශීය හා විදේශීය අවශ්‍යතා සඳහා,

- අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය
- අ.පො.ස. (උසස් පෙළ) විභාගය
- සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය
- බෞද්ධ ධර්මාචාර්ය විභාගය
- මූලික පිරිවෙන් අවසාන විභාගය
- කතෝලික ධර්මාචාර්ය විභාගය
- ජාතික නැටුම් සංගීත විභාගය
- කාර්මික විද්‍යාල විභාග
- ගුරු විද්‍යාල අවසාන විභාගය ආදී විභාගවල,
  ප්‍රතිඵල සනාථ කිරීම, විභාග සහතිකපත්‍ර නිකුත් කිරීම, නාම සංශෝධන සිදු කිරීම මෙන්ම දහම් පාසල් අවසාන විභාගයේ ප්‍රතිඵල ඒකාබද්ධ කිරීම, සනාථ කිරීම, සහතික පත්‍ර නිකුත් කිරීම සහ මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන අනෙකුත් කාර්යයන් අතර ප්‍රධාන තැනක් ගනී.

05. සේවාලාභීන් සඳහා විභාග සහතික පත්‍ර නිකුත් කිරීම එක්දින සේවා ක්‍රමය හා සාමාන්‍ය සේවා ක්‍රමය යටතේ සිදු කරනු ලබන අතර, මේ වන විට මාර්ගගත (Online) ක්‍රමය හා විද්‍යුත් තැපැල් (e-mail) මගින් සහතික නිකුත් කිරීම දක්වා මෙම කාර්යය ප්‍රවර්ධනය වී ඇත.

06. දැයේ දූවා දරුවන්ට ගුණාත්මක තත්ත්වයෙන් හා නිරවද්‍යතාවයෙන් යුත් විභාග ප්‍රශ්න පත්‍ර සහ ලකුණු දීමේ පටිපාටි ඇතුළත් ප්‍රශ්නෝත්තර පොත් නිකුත් කිරීම සඳහා පෞද්ගලික පොත් ප්‍රකාශන ආයතන වෙත අවසර ලබාදීම ද විභාග දෙපාර්තමේන්තුවේ තවත් කාර්යභාරයකි. මෙහි දී අදාළ පොත් ප්‍රකාශන ආයතන ලියාපදිංචි කිරීම සහ ප්‍රශ්නෝත්තර පොත් වෙළඳපොලට නිකුත් කිරීමට අවසර ලබාදීම මෙන්ම අදාළ සමාගම් වෙත පනවන ලද නීතිවලට එරෙහිව ක්‍රියාත්මක වන්නන් පිළිබඳ දැඩි නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගැනීම.

07. තෝරාගත් විදේශීය විභාග, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අ.පො.ස. (සාමාන්‍ය පෙළ) හා අ.පො.ස. (උසස් පෙළ) විභාගවලට සමාන කිරීම ද මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන තවත් සුවිශේෂී කාර්යයකි. අදාළ සහතික පත්‍රවල මුල් පිටපත් ඉතා නිවැරදි ව පරීක්ෂා කිරීමෙන් අනතුරුව මෙම සමාන කිරීම් සිදු කරයි.

08. විභාග පැවැත්වීමේ දී වැඩිවෙමින් පවතින විභාග අක්‍රමිකතා අවම කර, වඩාත් සාධාරණ හා විශ්වසනීය ලෙස විභාග පැවැත්වීම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණකි. මේ සඳහා විභාග අපේක්ෂකයන් මෙන්ම විභාග කාර්ය මණ්ඩලය අතින් ද සිදුවන සියලු අක්‍රමිකතා නිවැරදිව විමර්ශනය කොට වරදේ ස්වභාවය අනුව ඊට අදාළ පියවර ගැනීම.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව සියලුම අභියෝගවලට සාර්ථකව මුහුණ දෙමින් පාසල් විභාග, බඳවා ගැනීම් හා අනෙකුත් විභාග කඩිනමින් පැවැත්වීමට කටයුතු කරන අතර, මෙම සියලුම කාර්යයන් සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඒකාබද්ධව විශ්වසනීයතාව හා රහස්‍යතාව අතිශයින් ආරක්ෂා කර ගනිමින් සාධාරණ හා වලංගු විභාග පැවැත්වීමේ ජාතික මෙහෙවරක සාර්ථකව නිරත වී සිටියි.

2. විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන



SE	School Examination	**A & ER**	Assessment & Evaluations Reforms
IE	Institution Examination	**ADMIN**	Administration
AGCX	Additional Commissioner General	**INV**	Investigation
COMM OF EX	Commissioner of Examinations	**R & D**	Research and Development
DCX	Deputy Commissioner of Examinations	**DE**	Data Entry
ACX	Assistant Commissioner of Examinations	**EVA**	Evaluation
AO	Administrative Officer	**FIN**	Finance
ICT OFF	ICT Officer	**CER**	Certificate
D (ICT)	Director (ICT)	**SUP**	Supply
DD (ICT)	Deputy Director (ICT)	**TEC**	Technology
AD (ICT)	Assistant Director (ICT)	**PLA & MON**	Planning and Monitoring
ORG & RES	Organization and Result	**CON**	Confidential

3. විභාග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ශාඛා

- පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව
- රහස්‍ය (පාසල් විභාග) ශාඛාව
- ඇගයීම් (පාසල් විභාග) ශාඛාව
- විමර්ශන ශාඛාව
- සහතික පත්‍ර ශාඛාව
- පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
- තක්සේරුකරණ හා ඇගයීම් ප්‍රතිසංස්කරණ ශාඛාව
- සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව
- රහස්‍ය (ආයතනික විභාග) ශාඛාව
- ඇගයීම් (ආයතනික විභාග) ශාඛාව
- ප්‍රතිඵල ශාඛාව
- ආයතන ශාඛාව
- තැපැල් ශාඛාව
- ගිණුම් ශාඛාව
- සැපයීම් ශාඛාව
- ගබඩා කළමනාකරණ හා තොග පාලන ශාඛාව
- මුද්‍රණාලය
    - මුද්‍රණාලය (රහස්‍ය)
    - මුද්‍රණාලය (රහස්‍ය නොවන)
- පරිගණක ශාඛාව
- දත්ත සටහන් ශාඛාව
- මාර්ගගත ශාඛාව
- සැලසුම් ක්‍රියාත්මක කිරීමේ හා නියාමන ශාඛාව
- අභ්‍යන්තර විගණන ශාඛාව

4. විභාග දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය හා ඉදිරි දැක්ම

4.1 ලබාගන්නා ලද විශේෂ ජයග්‍රහණ හා මුහුණ දුන් අභියෝග

- 2025 වසරේ පැවති අ.පො.ස. (උසස් පෙළ) විභාගය අතරතුර මුළු රටටම බලපෑ දිට්වා සුළි කුණාටුව හමුවේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබූ පාසල් විභාග හා ආයතනික විභාග සියලු ම අපේක්ෂකයන්ට අගතියක් නොවන ආකාරයෙන් 2026 වර්ෂයේ ජනවාරි මස පවත්වා ප්‍රමාදයකින් තොරව ප්‍රතිඵල නිකුත් කිරීමට හැකි වීම දෙපාර්තමේන්තුවක් ලෙස ලද සුවිශේෂී ජයග්‍රහණයකි.

- දෙපාර්තමේන්තුවේ සේවයෙහි නියුතු නිලධාරීන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කර ගැනීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන්වලට යොමු කරන ලද අතර, එමඟින් දෙපාර්තමේන්තුවේ ඉලක්කගත කාර්යයන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටු කර ගැනීමට හැකියාව ලැබීම.

- මාර්ගගත පද්ධතිය වැඩිදියුණු කිරීම මගින් විදේශ සහතික පත්‍ර ලබා ගැනීමේදී විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත නොගොස් විද්‍යුත් තැපැල (E-mail) ඔස්සේ විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් සහතික කරන ලද සහතික පත්‍රවල මෘදු පිටපතක් (Soft Copy) ලබා ගැනීමට හැකිවන පරිදි පද්ධතිය වැඩි දියුණු කිරීම මගින් 2025 වර්ෂයේ 204,928 සහතික පත්‍ර ප්‍රමාණයක් නිකුත් කිරීමට හැකියාව ලැබීම.

- රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ හා වෙනත් රාජ්‍ය ආයතනවල, විභාග ප්‍රතිඵල සනාථ කර ගැනීම, මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සිදු කර ගැනීමට අවස්ථාව ලැබෙන පරිදි පද්ධතිය වැඩිදියුණු කිරීම.

- විභාග දෙපාර්තමේන්තුව සතු දත්ත පද්ධතියෙහි ඇතුළත් නොවන 1991 හා 1995 වර්ෂයන්හි අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාග හා 1985 සිට 1990 දක්වා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) හා අ.පො.ස. (උසස් පෙළ) විභාගයන්හි ප්‍රතිඵල ලේඛන පිටු 386,348 ක 4,991,090 ක දත්ත ප්‍රමාණයක් මේ වන විට පරිලෝකනය කිරීමේ හා දත්ත ඇතුලත් කිරීමේ කටයුතු අවසන් කර ඇත.

- අදාළ දත්ත මේ වන විට Server උපාංගයක ගබඩා කිරීමට කටයුතු කර ඇති අතර එම දත්ත භාවිතා කරමින් සහතික පත්‍ර මුද්‍රණය පරීක්ෂණ මට්ටමින් ක්‍රියාත්මක කරමින් පවතී.

- පාසල් විභාග නැවත සමීක්ෂණ මණ්ඩලවල සිදුවන වෙනස්කම් යාවත්කාලීන කිරීමේ කටයුතු සඳහා නව මාර්ගගත පද්ධතියක් හඳුන්වා දීම.

- ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් දහම් පාසල් අවසාන විභාගවල (බෞද්ධ, හින්දු, මුස්ලිම් හා කතෝලික) සහතික පත්‍ර නිකුත් කිරීමට කටයුතු කිරීම මගින් දේශීය මෙන්ම විදේශීය භාවිතය සඳහා ද එම සහතික පත්‍ර යොදා ගැනීමට හැකියාව ලැබීම.

- බඳවා ගැනීම්, උසස් කිරීම් හා කාර්යක්ෂමතා කඩඉම් යනා දී සියලු ම ආයතනික විභාගවල ප්‍රවේශ පත්‍ර මාර්ගගත ක්‍රමය ඔස්සේ බාගත කිරීමේ පහසුකම් සැලසීම තුළින් තැපැල් මගින් ප්‍රවේශ පත්‍ර නොලද අයදුම්කරුවන්ට දෙපාර්තමේන්තුවට පැමිණීමකින් තොරව තම ප්‍රවේශ පත්‍රය ලබා ගත හැකිවීම.

- 2025 වර්ෂයේ දී ජාතික විභාග වන 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය, අ.පො.ස(සා.පෙළ) විභාගය සහ අ.පො.ස(උ.පෙළ) විභාගය මෙන්ම ආයතනික විභාග 91 ක් ද එකම කාලවකවානුවක පවත්වන ලද අතර, අයහපත් කාලගුණ තත්ත්වය මධ්‍යයේ වුව ද දිවයින පුරා ඇගයීම් මධ්‍යස්ථාන පිහිටුවා එම විභාග සියල්ලෙහිම උත්තර පත්‍ර ඇගයීම් කටයුතු නියමිත කාල සීමාව තුළ නිම කිරීමට හැකි වීම.

- මෙතෙක් පැවති තැපැල් මගින් අයදුම්පත් යොමු කිරීමේ ක්‍රමවේදය වෙනුවට 90% පමණ විභාග සඳහා මාර්ගගත ක්‍රමයට අයදුම් කිරීමට සැලසීම තුළින් අයදුම්පත් ප්‍රමාදයකින් තොරව නියමිත දිනට ලැබීමත්, අයදුම්පත්‍ර සඳහා වැය වන කඩදාසි භාවිතය අවම වීමත් සිදුවීම.

- ප්‍රසම්පාදන ක්‍රියාවලිය වේගවත් හා වඩාත් පහසු කිරීමේ අරමුණින් ඊ-ප්‍රසම්පාදන (E-procurement) ක්‍රමවේදය ආරම්භ කිරීමේ මූලික පියවර තැබීම.

4.2 2026 වර්ෂය සඳහා සැලසුම් කර ඇති වැඩසටහන්

- මාණ්ඩලික නිලධාරීන් සඳහා කළමනාකරණ කුසලතා සහ තොරතුරු තාක්ෂණ කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.

- සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා MS Office සම්බන්ධ පුහුණු වැඩසටහන්, නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පිළිබඳ පුහුණු වැඩසටහන්, විභාග වංචා, අක්‍රමිකතාවලට අදාළව විධිමත් විමර්ශන පැවැත්වීම සම්බන්ධ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

- පාසල් මට්ටමේ තක්සේරුකරණය පිළිබඳ පර්යේෂණ සිදු කිරීම හා එම පර්යේෂණ මත පදනම්ව පවතින හා යෝජිත පාසල් පාදක තක්සේරුකරණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම.

- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා තක්සේරුකරණය හා ඇගයීමට අදාළ උසස් අධ්‍යාපන අවස්ථා සහ පුහුණු (දේශීය, විදේශීය, දිගු කාලීන හා කෙටි කාලීන) ලබා දීම.

- නව තක්සේරුකරණ වැඩපිළිවෙල පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය හා සම්බන්ධ අදාළ පාර්ශ්වකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.

- අධ්‍යාපනික ඇගයීම් ක්ෂේත්‍රය සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම.

- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සහ දෙපාර්තමේන්තුවෙන් සේවා ලබා ගැනීමට පැමිණෙන මහජනතාවගේ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා දෙපාර්තමේන්තුව තුළ සනීපාරක්ෂක හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.

- විභාග ක්‍රියාවලිය සහ සහතික පත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව සිදු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.

- සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ව්‍යාපෘති අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.

- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි පරිශ්‍රය ප්‍රතිසංස්කරණය කිරීම.

- විභාග දත්තවල අඛණ්ඩතාව හා රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග ක්‍රියාවලිය හා සහතිකපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියට අදාළ ප්‍රධාන පරිගණක පද්ධතිය වන AS 400 පරිගණක පද්ධතිය නඩත්තු හා සේවා කිරීම නවීකරණය.

- පර්යේෂණ හා සංවර්ධන ශාඛාවේ පුස්තකාලය නවීකරණය හා අලුත් කිරීමේ ව්‍යාපෘතිය

- ආකෘතික ඇගයීම් ක්‍රමවේදයන් පිළිබඳ ජාත්‍යන්තර පුහුණුව මගින් විභාග ප්‍රතිසංස්කරණ සඳහා ධාරිතා සංවර්ධනය සහ විභාග දෙපාර්තමේන්තුවේ ඇගයීම් කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය පහසුකම් පුළුල් කිරීම

- දෙපාර්තමේන්තුව සඳහා යන්ත්‍රෝපකරණ, ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණ මිලදී ගැනීම හා නව CCTV නිරීක්ෂණ පද්ධතියක් ස්ථාපනය කිරීම.

- පරිගණක ශාඛාවේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා මෘදුකාංග සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු පරිශ්‍රය තුළ සේවාදායක පරිගණකයක් (In house server) ස්ථාපනය කිරීම සහ වර්ණ offset මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීම.

- විභාග ප්‍රතිඵල ලේඛන සහ පැරණි ලේඛන සංරක්ෂණය සඳහා ඩිජිටල් ලේඛනාගාර පද්ධතියක් සංවර්ධනය කිරීම.
- පහත සඳහන් විභාගයන්හි උත්තර පත්‍ර ඇගයීම් කටයුතු නිසි පරිදි ඉටු කිරීම සඳහා වැඩසටහන් සැලසුම් කර ඇත.

  - අ.පො.ස. (උසස් පෙළ) විභාගය - 2026
  - අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය - 2026
  - 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය - 2026
  - සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය - 2026
  - ගුරු විද්‍යාල අවසාන විභාගය - 2026
  - ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා අවසාන විභාගය - 2026
  - සීතාවක පිරිවෙන් අවසාන විභාගය - 2026

5. 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

5.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025		සටහන	තතය 2025	තතය 2024	
රු.			රු.	රු.	
	ආදායම් ලැබීම		394,887,099	184,822,080	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
220,000,000	බදු නොවන ආදායම් හා වෙනත්	4	394,887,099	184,822,080	
220,000,000	මුළු ආදායම් ලැබීම් (අ)		394,887,099	184,822,080	
-	ආදායම් නොවන ලැබීම්		-		
12,051,609,250	භාණ්ඩාගාර අග්‍රිම		7,616,222,000	6,901,309,000	ඒසීඒ-3
-	තැන්පතු		139,236,869	162,134,551	ඒසීඒ-4
25,000,000	අත්තිකාරම් ගිණුම		38,943,757	34,804,993	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
12,076,609,250	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		7,794,402,626	7,098,248,544	
12,296,609,250	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		8,189,289,725	7,283,070,623	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		186,407,731	55,491,999	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		8,002,881,993	7,227,578,625	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්		-		
706,000,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	684,618,575	547,924,107	
10,882,540,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	7,451,288,374	6,813,655,325	ඒසීඒ-2(ii)
4,200,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	3,830,848	4,024,898	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
11,592,740,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		8,139,737,798	7,365,604,330	
	මූලධන වියදම්				
171,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	10	113,688,082	50,400,958	
491,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	62,279,860	228,001,620	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
5,260,000	හැකියා වර්ධනය	14	5,254,459	995,145	
100,000,000	වෙනත් මූලධන වියදම්	15	78,997,849	-	
767,260,000	මුළු මූලධන වියදම් (උ)		260,220,251	279,397,723	
	තැන්පතු ගෙවීම්		88,109,212	235,303,503	ඒසීඒ-4
22,000,000	අත්තිකාරම් ගෙවීම්		38,494,383	26,975,351	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
22,000,000	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		126,603,595	262,278,854	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		8,526,561,644	7,907,280,907	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(523,679,651)	-679,702,282	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		-523,679,651	-679,702,282	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය				ඒසීඒ-3
			0	0	

1

5.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තතය 2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	4,651,643,329	3,936,230,545
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	68,856,064	69,305,438
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3		
මුළු වත්කම්		**4,720,499,393**	**4,005,535,983**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		-211,920,525	-160,343,495
දේපළ පිරියත හා උපකරණ සංචිතය		4,651,643,329	3,936,230,545
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	280,776,589	229,648,933
අග්‍රිම ශේෂය	ඒසීඒ-3		
මුළු වගකීම්		**4,720,499,393**	**4,005,535,983**

පිටු අංක 7 සිට 29 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 30 සිට 39 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2025.12.17** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **02/2025** **විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

....	....	....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	
දිනය : 2026/02/27	දිනය : 2026.02.27	දිනය : 2026.02.27

නාලක කළුවැව
ලේකම්
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ
විභාග කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල.

ආර්. දමයන්ති
කොමසාරිස් (මුදල්)
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

5.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සත්‍ය 2025 රු.	සංශෝධිත 2024 රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	376,315,316	171,518,329
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	378,388,155	519,794,504
අග්‍රිම ලැබීම්	7,616,222,000	6,901,309,000
අත්තිකාරම් අයකර ගැනීම	41,721,290	36,460,967
තැන්පතු ලැබීම්	139,236,869	162,134,551
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**8,551,883,630**	**7,791,217,350**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	7,950,263,588	7,121,191,043
සහනාධාර සහ මාරුකිරීම්	3,830,848	4,024,898
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	212,093,894	225,979,100
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	24,710,507	68,291,093
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	186,407,731	55,491,999
අත්තිකාරම් ගෙවීම්	38,341,493	27,517,092
තැන්පතු ගෙවීම්	88,109,212	235,303,503
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**8,503,757,273**	**7,737,798,728**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**48,126,357**	**53,418,623**
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
මූලධන වත්කම් ඉදිකිරීම, මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	48,126,357	53,418,623
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**48,126,357**	**53,418,623**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(48,126,357)**	**(53,418,623)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	0	0
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	0	0
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

5.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

ඇමුණුම - (i)

පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය
(මු.රෙ. 106 හා මු.රෙ. 113 යටතේ වන පාඩු)

වියදම් ශීර්ෂ අංකය: 212 දෙපාර්තමේන්තුවේ නම :විභාග දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය :

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/කපාහැරීම/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

	අගය		සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු	25,000.00	අඩු		
රු	25,000.01	වැඩි		
	එකතුව		-	නැත

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1		
2		
3		
4		
එකතුව	-	නැත

(ii) තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශනය

	අගය		සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු	25,000.00	අඩු		
රු	25,000.01	වැඩි		
	එකතුව		-	-

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1		
2		
3		
4		
එකතුව	-	-

(ii) අනුව කාල විශ්ලේෂණය

වසර 5 ට අඩු	සිද්ධි සංඛ්‍යාව	
	ගණන	රු
වසර 5-10	සිද්ධි සංඛ්‍යාව	
	ගණන	රු
වසර 10 ට වැඩි	සිද්ධි සංඛ්‍යාව	
	ගණන	රු

සටහන - වැය ශීර්ෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මු .රෙ. 106 යටතේ වන හානි හා මු.රෙ 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය .

....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)

දිනය : 2026.02.27

* තම වාර්තාකරණ ආයතනයේ මෙම වාර්තාවලට අදාළව තොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

ඕ.පී.ආර්. දමයන්ති
කොමසාරිස් (මුදල්)
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

ඇමුණුම -(ii)

පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 2 212 දෙපාර්තමේන්තුවේ නම :විභාග දෙපාර්තමේන්තුව

1 **වර්ෂය තුළ සිදුවූ මු.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය**

	අගය	සිද්ධි සංඛ්‍යාව	වටිනාකම (රු)
(i)	රු. 25,000.00 අඩු	....	....
(ii)	රු. 25,000.01 වැඩි	....	....
එකතුව		-	-

2 **වර්ෂය තුළ මු.රෙ. 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශනය**

	අලාභයේ ස්වභාවය	ආරම්භක කපා නොහල ශේෂය රු.	අලාභයේ වටිනාකම රු.	අයකර ගැනීම් රු.	පොතෙන් කපා හල අගය රු.	කපා නොහල ඉදිරියට ගෙනයන ශේෂය රු.	පොතෙන් කපා හැරීම සඳහා වූ අනුමැතියේ යොමු අංකය
1							
2							
3				නැත			
4							
5							
6							
එකතුව		-	-	-	-	-	-

සටහන - සටහන (i) හි ඇතුළත් ගිණුම්ගත කළ යුතු පාඩු හා අත්හැරීම් හැර මු .රෙ. 109 යටතේ වන අනෙකුත් පාඩු හා අත්හැරීම් පමණක් මෙම ආකෘතියේ ඇතුළත් කළ යුතු ය.

....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/

අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)

දිනය : 2026.02.27

ඕ.පී.ආර්. දමයන්ති
කොමසාරිස් (මුදල්)
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

* තම වාර්තාකරණ ආයතනයේ මෙම වාර්තාවලට අදාළව තොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය .

31

ඇමුණුම - (iv)

බැරකම් පිළිබඳ ප්‍රකාශනය - (i)

මු.රෙ.94 (2) සහ (3) ප්‍රකාරව බැරකම්වලට එළඹෙන ලද බැඳීම් ප්‍රකාශනය

දෙපාර්තමේන්තුවේ නම:විභාග දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය: 212

පුද්ගලයාගේ/ආයතනයේ නම	බැඳීම් පිළිබඳ විස්තරය	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය	මු.රෙ. 94(2) හි සඳහන් ප්‍රතිපාදන අනුව එළඹිය හැකි උපරිම බැඳීම් සීමාව (රු.)	මු.රෙ. 94(3) අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.)	බැඳීම් හා බැරකම් වටිනාකම (රු.)
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු								
....								
....								
එකතුව								
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල								
....								
....			කිසිවක් නොමැත					
එකතුව								
3. වෙනත් (පෞද්ගලික අංශය)								
....								
....								
එකතුව								
මුළු එකතුව								

....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2026.02.27

ඩී.පී.ආර්. දමයන්ති
කොමසාරිස් (මුදල්)
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

37

ඇමුණුම - (vii)

අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශනය

දෙපාර්තමේන්තුවේ නම:විභාග දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය: 212

වැඩසටහන් අංකය හා නාමය:

දිනය	වවුචර් අංකය	ආදායකයාගේ නම	ගෙවීමේ ස්වභාවය	ගණන (රු)
		කිසිවක් නොමැත		

....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/

අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)

දිනය : 2026.02.27

ඕ.පී.ආර්. දමයන්ති
කොමසාරිස් (මුදල්)
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

* තම වාර්තාකරණ ආයතනයේ මෙම වාර්තාවලට අදාළව තොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

38

ඇමුණුම - (viii)

2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2025.12.31 දිනට තත්ත්ව වාර්තාව

වියදම් ශීර්ෂ අංකය: 212 දෙපාර්තමේන්තුවේ නම : විභාග දෙපාර්තමේන්තුව

අනු අංකය	බැංකුවේ නම	ගිණුම් අංකය	2025.12.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය (රු.)	2025.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය (රු.)	2025.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇතොත්)	අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය
1	ලංකා බැංකුව	7041225	237,348,489	-	-	2025 දෙසැම්බර්
2	ලංකා බැංකුව	7041229	450	-	-	2025 දෙසැම්බර්
3	ලංකා බැංකුව	7041227	4,233,280	-	-	2025 දෙසැම්බර්
4	ලංකා බැංකුව	7041228	0	-	-	2025 දෙසැම්බර්
5	මහජන බැංකුව	208-100169026223	64,430,443	-	-	2025 දෙසැම්බර්

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට තහවුරු කරමි .

....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2026. 02. 27

ඩී.පී.ආර්. දමයන්ති
කොමසාරිස් (මුදල්)
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

39

5.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2003.02.13	විභාග හා අනෙකුත් ගාස්තු	190,000,000	220,000,000	394,887,099	179%

5.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	11,610,000,000	11,592,740,000	8,139,737,798	70%
ප්‍රාග්ධන	750,000,000	767,260,000	260,220,251	34%

5.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගිතා ප්‍රගතිය
			මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
01.	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය	කළමනාකරණ සේවා III පන්තිය EB සඳහා	375,345.18	-	375,345.18	**100%**
02.	වාරිමාර්ග දෙපාර්තමේනතුව	වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගබඩා භාරකරු III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය	1,168,000.00	1,048,877.34	2,216,877.34	**100%**
03.	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	අත්තිකාරම් බී ගිණුමේ ණය ශේෂ අයකර ගැනීම සඳහා	757,531.87	-	757,531.87	**100%**
04.	අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය	ද්වීතියික අධ්‍යාපන ආංශික වැඩි දියුණු කිරීමේ වැඩසටහන	108,000,000	-	19,561,426.92	**18.1%**

5.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2025.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය (% ලෙස)
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්		2,048,896,142.92		
9152	යන්ත්‍රෝපකරණ		935,847,746.78		
9153	ඉඩම්		635,700,000.00		
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ		275,273,539.91		
9180	බදු දෙන ලද වත්කම්				

5.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } EDU/B/EPD/FA/01/25	ඔබේ අංකය / உமது இல. / Your No. }	දිනය / திகதி / Date } 2026 ජුනි ၂၆ දින

ගණන්දීමේ නිලධාරී,
විභාග දෙපාර්තමේන්තුව.

ශීර්ෂය 212 - විභාග දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 212 - විභාග දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විභාග දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துாவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව විභාග දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව විභාග දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව විභාග දෙපාර්තමේන්තුවේ විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව විභාග දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම

විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන සහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වටිනාකම රු. මිලියන 630 ක් ලෙස 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුලත් කර තිබූ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති නාගරික සංවර්ධන අධිකාරිය සතු හෙක්ටයාර් 1.3596 ක ඉඩමේ නීත්‍යානුකූල අයිතිය දෙපාර්තමේන්තුවට පවරා ගෙන නොතිබුණි.

(ආ) මහවැලි අධිකාරිය විසින් 2020 ජුනි මාසයේ දෙපාර්තමේන්තුවට පවරා දෙන ලද ඇඹිලිපිටිය පල්ලේගම පිහිටි හෙක්ටයාර 0.0960 ක ඉඩම තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) වටිනාකම රු.මිලියන 15,750 ක් වූ මෝටර් රථ 04 ක් සිගාස් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය වනවිට දෙපාර්තමේන්තුව භාවිතා කරන පරිගණක මෘදුකාංග වැඩසටහන් 10 ක් පැවතුණු නමුත් ඒවා තක්සේරු කර අස්පෘශ්‍ය වත්කම් යටතේ සිගාස් වැඩසටහන තුල වූ ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර නොතිබුණි.

1.6.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) විභාග දෙපාර්තමේන්තුවේ සාම්ප්‍රදායික මුද්‍රණාලවල භාවිතා කරනු ලබන මුද්‍රණ යන්ත්‍ර ඉන්වෙන්ට්‍රි ලේඛන අනුව හඳුනාගත හැකි වුවත්, සිගාස් වැඩසටහන තුල වූ ස්ථාවර වත්කම් ලේඛනයට එම යන්ත්‍ර ඇතුලත් කර තිබුණේද යන්න තහවුරු කරගත නොහැකි විය.

(ආ) 2005 දෙසැම්බර් 24 දින මිලදීගෙන තිබුණු Stitch Master Gethering and Wire Stitching යන්ත්‍රය ක්‍රියාකිරීමේ දී කොළ ඉවතට හැලීම හේතුවෙන් මිලදීගත් දින සිට භාවිතයෙන් ඉවත් කර නිශ්ක්‍රියව පැවතුණු අතර මෙම යන්ත්‍රයේ වටිනාකම, මිලදීගත් ආයතනය ඇතුළු විස්තර ඇතුළත් ලිපිගොනුව දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි.

(ඇ) වසර 20 කට පෙර කාලයක සිට සාම්ප්‍රදායික මුද්‍රණාලවල පවතින මුද්‍රණ යන්ත්‍රවල හා අනෙකුත් යන්ත්‍රවල ලිපිගොනු දෙපාර්තමේන්තුව සතුව නොතිබුණු බැවින් එම යන්ත්‍රවල නඩත්තු හා අලුත්වැඩියා කටයුතු ඉටුකිරීම වෙනුවෙන් 2018 වර්ෂයේ දී විවෘත කරන ලද ලිපිගොනු පමණක් සැපයීම් ශාඛාව තුළ පවත්වාගෙන ගොස් තිබුණි.

1.6.3 හෙළිදරව් කිරීම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු හා සිද්ධීන් ඇති අවස්ථාවලදී එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් "වාර්තා කරණ පදනම" යටතේ සිදුකළ යුතු බවට, 2025 පෙබරවාරි 18 දිනැති රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අංක SA/MAA/02/01/01 දරන ලිපිය මඟින් නිකුත් කර ඇති 06/2024 දරන චක්‍රලේඛයට සිදුකරන ලද සංශෝධන යටතේ සඳහන් කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් පහත කරුණු මූල්‍ය ප්‍රකාශන සටහන් තුළ හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ආයතනවලින් ගාස්තු අයකර පවත්වන ලද නමුත් 2025 දෙසැම්බර් 31 දින වනවිට ප්‍රතිඵල නිකුත් නොකරන ලද විභාග පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි.

(ආ) අසම්භාව්‍ය බැරකමක් විය හැකි 2025 දෙසැම්බර් 31 දින වනවිට විභාග අපේක්ෂකයින්, විභාග කාර්ය මණ්ඩලය හා අනෙකුත් පාර්ශවයන්ට පවරන ලද නඩු හා විනය විමර්ශන පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) විභාග කටයුතු සඳහා ප්‍රශස්ථ තොගයක් පවත්වා ගත යුතු මෙන්ම 2025 දෙසැම්බර් 31 දිනට එම තොග වටිනාකම හඳුනාගත හැකි පරිදි තොග සමීක්ෂණය සිදුකර, එදිනට තොගයේ වටිනාකම ගණනය කර එය මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ හෙළිදරව් කර නොතිබුණි.

1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබීමත්, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබීමත්, පිළිබඳව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

	ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
(අ)	සිගාස් ස්ථාවර වත්කම් මොඩියුලය	2025 දෙසැම්බර් 17 දිනැති අංක 02/2025 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය.	හඳුනාගත් වෙනස්කම් නිවැරදි කර ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.
(ආ)	වාහන ලේඛනය	මුදල් රෙගුලාසි 1645	වාහන 06 ක් ලේඛනයට ඇතුලත් කර ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.
(ඇ)	හානි හා පාඩු ලේඛනය	මුදල් රෙගුලාසි 110 (1) (ii)	කාලීනව ලේඛනය යාවත්කාලීන කරමින් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඇ)	විදුලි සවිකිරීම් හා උපකරණ	මුදල් රෙගුලාසි 751(2)	ආරම්භයේ සිටම පවත්වා ගෙන ගොස් නොතිබුණි.
(ඉ)	වාහන ලොග් සටහන් පොත්	මු.රෙ. 1645 (අ)	යාවත්කාලීන කරමින් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාල වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශ	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1 (අ) (ii)	ඉඩම තක්සේරු කර ගිණුම්වලට ඇතුලත් කල යුතුය.	1.6.1. (ආ)
1.6.1. (අ) (i)	ඉඩම පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කල යුතුය.	1.6.1. (අ)

3. **මූල්‍ය සමාලෝචනය**

3.1 **වියදම් කළමනාකරණය**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාග්ධන වැය විෂයයන් 06 ක් හා පුනරාවර්තන වැය විෂයයන් 11 ක් සඳහා වෙන්කර තිබුණු එකතුව රු. මිලියන 11,336 ක ශුද්ධ ප්‍රතිපාදනවලින් රු. මිලියන 3,927 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර එය සියයට 14 ත් 92 ත් අතර පරාසයක වී තිබුණි.

(ආ) වැය විෂයයන් 04 ක මු.රෙ. 66 මඟින් රු.මිලියන 131 ක් මාරු කිරීමෙන් පසුව මුල් ප්‍රතිපාදනයෙන් රු.මිලියන 357 ක් උපයෝජනයකින් තොරව පැවති අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 ක් වී තිබුණි. තවද වැය විෂයයන් 02 ක් සඳහා මු.රෙ. 66 මඟින් වෙනත් වැය විෂයයන්ගෙන් ලබාගත් එකතුව රු.මිලියන 56 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණු අතර එම වැය විෂයයන් 02 හි මුල් ප්‍රතිපාදනයෙන් රු. මිලියන 377 ක් උපයෝජනයකින් තොරව පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ රජයේ ආයතනවල විභාග 237 ක් පැවැත්වීම සඳහා රු.මිලියන 656 ක ප්‍රතිපාදන වෙන් කරගෙන විභාග 91ක් පැවැත්වීම හේතුවෙන් රු.මිලියන 312ක ප්‍රතිපාදන ඉතිරිව පැවතියදී එම රජයේ ආයතනවලින් ආයතනික විභාග 91ක් පැවැත්වීම සඳහා විභාග දෙපාර්තමේන්තුව විසින් අධිකාරී බලයකින් තොරව රු.මිලියන 202 ක මුදලක් ලබාගැනීමට කටයුතු කර තිබීම හේතුවෙන් එකම කාරණයට දෙවරක් ජාතික අයවැයෙන් ප්‍රතිපාදන වෙන්කර ගැනීමක් සිදුකර තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව විසින් රජයේ ආයතන සම්බන්ධයෙන් පවත්වා තිබුණු විභාග 124ක් සඳහා එම රජයේ ආයතනවලින් 2023 වර්ෂයේ සිට අයකර, 2025 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන පැවති රු.මිලියන 157 ක මුදලක් අධිකාරී බලයකින් තොරව අයකර, අදාල වැය විෂයයට බැර (අධිභාර) කිරීම සිදු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබීම හේතුවෙන් 212-02-02-02-1409 වැය විෂයය යටතේ වූ රජයේ වියදම රු.මිලියන 157 කින් වැඩිවීමක් සිදුවන පරිදි එම මුදල් ලබාගත් එක් එක් වර්ෂයේදී ගිණුම් ගතකර තිබුණි.

(ඉ) 2023 – 2025 කාලසීමාවේදී විභාග පැවැත්වීමට දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදන වෙන්කර තිබියදී රාජ්‍ය ආයතන 124 ක විභාග පැවැත්වීමට අධිකාරි බලයකින් තොරව අයකරන ලද රු.මිලියන 157 ක් 2025 දෙසැම්බර් 31 දින වන විටත් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඊ) 2023 වර්ෂයේ සිට වෙනත් ආයතනවලින් ලබාගන්නා ලද විභාග 14 කට අයකල රු.මිලියන 27 ක් පොදු තැන්පත් ගිණුමේ වර්ෂ 02 ක් රඳවාගෙන 2025 දෙසැම්බර් 31 දින අංක 2003-02-13 දරන විභාග ගාස්තු ආදායමට වර්ෂ 02කට පසුව බැරකර තිබුණි.

(උ) විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන ආයතනික හා පාසල් විභාග සඳහා ජාතික අයවැය ලේඛනය තුල ප්‍රතිපාදන වෙන්කිරීම ශීර්ෂය 212 යටතේ සංවර්ධන ක්‍රියාකාරකම් වැඩසටහන තුල ව්‍යාපෘති 02 ක් ලෙස වෙන් නොකරමින් 212-02-02 ඇගයීම් හා විභාග පැවැත්වීම් ව්‍යාපෘතියේ 212-02-02-001 හා 002 යටතේ උප ව්‍යාපෘති 02 ක් යටතේ ප්‍රතිපාදන වෙන් කරගෙන තිබීම හේතුවෙන් නිශ්චිතව පාසල් හා ආයතනික විභාග වියදම් ප්‍රධාන කාණ්ඩ 02 ක යටතේ හඳුනාගැනීමට නොහැකි වී තිබුණි.

3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයේ බැදීම් යටතේ දක්වා තිබෙන රු.මිලියන 534 ක් තුල පවතින, බැරකම් ඒ ඒ අංශය යටතේ නිශ්චිතව හඳුනාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව, බැදීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ A හා B ගොඩනැගිලිවල වැසිකිළි පද්ධතිය නවීකරණය කිරීම සඳහා සැපයුම්කරු වෙත ගෙවිය යුතු මුදල ගිණුම් ශාඛාවේ තොරතුරු අනුව රු.මිලියන 48 ක් වුවත් සැපයීම් ශාඛාවේ බැදීම් ලේඛනය අනුව එම අගය රු.මිලියන 55 ක් වූයෙන් රු.මිලියන 7 ක වෙනසක් පැවතුණි.

3.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (1) (ඇ) සහ 38 (2) වගන්ති ප්‍රකාරව එක් එක් අස්ථිත්වයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යන බවට සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචන සිදුකර අවශ්‍ය වෙනස්කම් සිදුකළ යුතු අතර එහි පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (1) (ඉ) වගන්ති ප්‍රකාරව විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.4 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට ප්‍රමාද වී පිළිතුරු ලබා දී තිබුණි.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

	නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.5 ඡේදය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 3.1 ඡේදය	දෙපාර්තමේන්තුවේ සේවය කරමින් සිටිය දී මියගිය, විශ්‍රාමගිය හා සේවය හැර ගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවියයුතු රු.736,608 ක් 2025 දෙසැම්බර් 31 දින වන විටත් අය කරගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය (i) මු.රෙ. 763	විශාල ප්‍රමාණයෙන් භාණ්ඩ තබාගන්නා දෙපාර්තමේන්තු විසින් ගබඩා ව්‍යවස්ථාවක් සකස් කොට පවත්වාගෙන යා යුතු බව දක්වා තිබුණ ද, දෙපාර්තමේන්තුව විසින් ගබඩා ව්‍යවස්ථාවක් සකස් කර අනුමත කරගෙන නොතිබුණි.
(ii) මු.රෙ. 1646	2025 වර්ෂය තුළ වාහන 5කට අදාල කිසිදු ධාවන සටහනක් විගණනයට ඉදිරිපත් නොවුණු අතර තවත් වාහන 19 ක මාස 3 සිට මාස 10 දක්වා කාලසීමාවක ධාවන සටහන් ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.
(iii) මු.රෙ. 1642 සහ 104(3) හා 104 (4)	වාහන සඳහා සිදුවන සියළු හදිසි අනතුරු, අනතුර කොතරම් සුළු වුවත් පොලිසියට වාර්තා කල යුතු වුවත් 2025 වර්ෂයේ සිදු වී තිබුණු වාහන අනතුරු 9 ක් පොලිසියට වාර්තා කර නොතිබුණු අතර එම අනතුරු වලට අදාල පූර්ණ වාර්තා හා අවසන් වාර්තා විගණිත දිනය වූ 2026 අප්‍රේල් 24 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.
(ඇ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි ඡේද 9.1 මඟින් සංශෝධිත මුදල් 371 (2) (ආ) ඡේදය	අතුරු අග්‍රිම ලබාගන්නා නිලධාරියා විසින් එම කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිම පියවිය යුතු වුවත්, එකතුව රු.6,340,140 ක් වූ අත්තිකාරම් 43 ක් දින 56 සිට දින 167 ක පරාසයක් දක්වා පියවීම ප්‍රමාද කර තිබුණි.
(ඈ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 6.5 ඡේදය	මානව සංවර්ධන සැලැස්ම සකස් කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම, නිපුනතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වගකීම ආයතනයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකුට ලිඛිතව පවරා , පත්කල ජ්‍යෙෂ්ඨ නිලධාරියාගේ නම, දුරකථන අංකය හා විද්‍යුත් තැපැල රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධන අංශය වෙත ලබා දිය යුතු වුවද 2026 අප්‍රේල් 30 දින වන විටත් එසේ සිදුකර නොතිබුණි.

(ඉ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	
	(i) ඡේදය	2022 වර්ෂයේ සිට දෙපාර්තමේන්තුව සතු වාහන 13ක ඉන්ධන දහනය පිළිබද පරීක්ෂාවන් සිදුකර නොතිබුණි.
	(ii) ඡේදය	දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළ සිදුකර තිබුණු රු.13,259,572 ක් වූ වාහන අලුත්වැඩියාවන් 108 ක් දීර්ඝ කාලයකට පෙර විශ්‍රාමලත් හා සුදුසුකම් නොලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ නිර්දේශ මත ගෙවා තිබුණි.
(උ)	2024 රාජ්‍ය මූල්‍ය කලමනාකරණ පනතේ 33 වන වගන්තිය	අභ්‍යන්තර විගණක විසින් ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂිකව ඉදිරිපත් කළයුතු වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

3.5 බැංකු ගිණුම් මෙහෙයවීම

අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු ලෙස ආයතනික විභාග බැංකු ගිණුමට ලැබී තිබුණු 2025 දෙසැම්බර් 31 දිනට හඳුනානොගත් ලැබීම් ශේෂය රු. 3,943,718 ක් පැවති අතර එයින් රු. 1,106,144 ක මුදලක් පොදු තැන්පත් ගිණුමට බැරකර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලැසුම් කිරිම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රසම්පාදන සැලැස්ම

2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1 වගන්තිය අනුව රටේ මධ්‍යකාලීන අයවැය රාමුව අනුව ඉදිරි වසර 03 ක කාලපරිච්ඡේදයක් වෙනුවෙන් අදාල ප්‍රසම්පාදන අස්ථිත්වයේ විෂයපථය යටතේ හඳුනාගෙන සැලසුම් කරනු ලබන ප්‍රසම්පාදන සියල්ල ඇතුලත් කොට ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතු වුවත්, 2025 වර්ෂය සඳහා හා පෙර සිටම ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි.

(ආ) මානව සම්පත් සංවර්ධන සැලැස්ම

2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අමතර වශයෙන් නිකුත් කර තිබුණු 2023 නොවැම්බර් 30 දිනැති 02/2018 (I) දරන චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා හඳුන්වා දී තිබුණු මාර්ගෝපදේශයේ 02 වගන්තිය අනුව ඇමුණුම I සිට X දක්වා ආකෘතිපත්‍ර සම්පූර්ණ කළ යුතු බව දක්වා ඇතත්, ආයතනය විසින් එම චක්‍රලේඛය ප්‍රකාරව 2025 වර්ෂයේ මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර නොතිබුණි.

(ඇ) **ආයතනික හා පාසල් විභාග සැලසුම්**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i. ප්‍රසිද්ධ විභාග පනත ප්‍රකාරව කොමසාරිස් ජනරාල්වරයාට පැවරුණු බලතල යටතේ සංවිධානය කොට විභාග පැවැත්වීම සඳහා ජාතික අයවැයට සමගාමීව හෝ තුන් අවුරුදු කාලසීමාවකට සැලැස්මක් මෙහෙයවමින් සමාලෝචිත වර්ෂයට අදාල යෝජිත සැලැස්ම හඳුනාගත යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබීම හේතුවෙන් වාර්ෂිකව ආයතනික විභාග වැඩසටහනට ඇතුලත් කරන බොහෝ ආයතනික විභාග එම විභාග වැඩසටහනට ඇතුලත් කල පරිදි පැවැත්වීමට විභාග දෙපාර්තමේන්තුවට හැකි වී නොතිබුණු බව අඛණ්ඩවම විගණනයට නිරීක්ෂණය විය. එසේම, පාසල් විභාග සැලැස්මද තුන් අවුරුදු කාලරාමුවක් තුල පිළියෙල කර නොතිබුණි.

ii. තුන් අවුරුදු කාලසීමාවක් අනුව පිළියෙල කරන පාසල් හා ආයතනික විභාග සැලසුම් අනුව වාර්ෂික සැලැස්ම නිශ්චිතව හඳුනාගෙන ඒ අනුව විභාග සංවිධානය කිරීමේ සිට ප්‍රතිඵල නිකුත් කිරීම දක්වා සම්බන්ධිත පාර්ශවයන් ඉවත් කරමින් මානව සම්පත් සැලැස්මද, ඒකාබද්ධව මුද්‍රණ යන්ත්‍ර ධාවන සැලැස්මද, මුද්‍රණ ද්‍රව්‍ය සැලැස්මද හා ප්‍රවාහන සැලැස්මද වශයෙන් වූ සැලසුම් සකස් කර විභාග සංවිධානය කර පැවැත්වීම සිදුකර නොතිබුණු බැවින් කාලීනව විභාග ප්‍රතිඵල නිකුත් කිරීම හා රාජ්‍ය නිලධාරීන් නියමිත කාලසීමාවන් තුළදී බඳවාගැනීම කාර්යක්ෂමව සිදුකිරීමට අහිතකර බලපෑමක් ඇතිවී තිබුණි.

4.1.2 **කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2026 මැයි 08 දින වන විටත් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණු බැවින් ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගතිය පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ආ) ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුලත් රු.මිලියන 346.09 කට ඇස්තමේන්තු කර තිබුණු කාර්යයන් 09 ක් 2025 දෙසැම්බර් 31 දින වන විටත් නිමකර නොතිබුණි.

(ඇ) පිරිවැය විශ්ලේෂණයකින් හා මුද්‍රණ යන්ත්‍ර ධාවන සැලැස්මකින් තොරව මුද්‍රණ ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීම

2022 -2025 දක්වා වසර 04 ක කාලසීමාව තුල පිළිතුරු ලියන පොත් මිලදීගැනීම සඳහා රු. 319,289,320 ක මුදලක්ද පිළිතුරු ලියන දෙවන කොළ මිලදීගැනීම සඳහා 2021-2025 කාලසීමාව තුළ රු. 298,977,266 ක මුදලක්ද වැය කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) විභාග දෙපාර්තමේන්තුවේ ස්ථාපිත රහස්‍ය ඩිජිටල් මුද්‍රණාලය, රහස්‍ය සාම්ප්‍රදායික මුද්‍රණාලය හා සාම්ප්‍රදායික රහස්‍ය නොවන මුද්‍රණාලය වශයෙන් වූ මුද්‍රණාල 03 සඳහා වාර්ෂික ඒකාබද්ධ මුද්‍රණ යන්ත්‍ර ධාවන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර ඒ අනුව දෙපාර්තමේන්තුවේ මුද්‍රණ යන්ත්‍ර

භාවිතා කර දෙපාර්තමේන්තුවේ මුද්‍රණ වලින් පිළිතුරු ලියන පොත් හා දෙවන කොළ මුද්‍රණය කරගැනීමේ හැකියාව සලකාබලා නොතිබුණි.

(ii) පිළිතුරු ලියන පොතක් සහ පිළිතුරු ලියන දෙවන කොළයක් මුද්‍රණය කිරීමට කොපමණ මුදලක් වැයවේද යන්න සියලුම අදාල තොරතුරු සාධාරණ කරුණු මත පදනම්ව පිළියෙල කර එම යන්ත්‍ර ඌන උපයෝජිත කාලය, එම කාර්යමණ්ඩලවල වැටුප් පිරිවැය නිෂ්කාර්යවීමද කොළයක පිරිවැයට අමතරව සලකා බලමින් විධිමත් පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි.

(iii) ඉහත (i) හා (ii) කරුණු පිළිබඳව අවධානය යොමු කරමින් හා දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණ යන්ත්‍ර උපරිම ධාරිතාවයකින් යුතුව භාවිතයට ගැනීම පිළිබඳව සලකා බැලීමකින් තොරව ආරම්භයේ සිටම පිළිතුරු ලියන පොත් හා දෙවන කොළ මිලදීගැනීමට කටයුතු කිරීම තුළ රජයේ මුදල් අරපිරිමැසුම්භාවයකින් තොරව වැයකර ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

4.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

4.1.3.1 විභාග ප්‍රතිඵල සනාථ කිරීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මාර්ගගතව ප්‍රතිඵල සනාථ කිරීම සඳහා විභාග දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතියට ඇතුළුවීමට බලතල ලබා දී ඇති රාජ්‍ය ආයතනවල බලයලත් සහතික කිරීමේ සහ බලයලත් තහවුරු කිරීමේ මාණ්ඩලික නිලධාරීන් දෙදෙනා සමඟ ඇතිකර ගත් ගිවිසුම්, සහතිකපත්‍ර ශාඛාව විසින් විධිමත්ව ඉදිරිපත් නොකෙරුණි. එසේම, එක් එක් ආයතනයේ ගිවිසුම්ගත නිලධාරීන් හඳුනාගැනීමට අත්සුහුරු ක්‍රමයට (manual) හෝ පරිගණකගත මෘදු පිටපතක් ලෙස එම තොරතුරු සහතිකපත්‍ර ශාඛාවේ හා තොරතුරු තාක්ෂණ අංශයේ පවත්වා ඒ සම්බන්ධව අධීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ආ) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන්ගේ ප්‍රතිඵල මාර්ගගතව සනාථ කිරීම සඳහා 2024 නොවැම්බර් 03 දිනැති නිලධාරීන් දෙදෙනෙකු නම් කර ඔවුන් පත්කරන ලෙස විභාග දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කර තිබුණද 2026 මැයි 15 දින වන විටත් එම නිලධාරීන් පත්කර නොතිබුණි.

4.1.3.2 සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය(GIT)

2004 මැයි 04 දිනැති 2004/20 චක්‍රලේඛය මගින් සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විෂය අ.පො.ස (උසස් පෙළ) 12 ශ්‍රේණියට හඳුන්වාදීම සිදුකර තිබුණි. 2019, 2023 හා 2025 වර්ෂයන්හි පැවැත්වූ සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගයන්හි (GIT) අයදුම්කළ, පෙනී සිටින ලද සිසුන් සංඛ්‍යාව හා වියදම පිළිබඳ සාරාංශගත තොරතුරු පහත පරිදිය.

වර්ෂය	අ.පො.ස. (උ.පෙ) විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව	GIT විභාගයට අයදුම් කළ සිසුන් සංඛ්‍යාව	GIT විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව
2019	235,550		
2020	251,168		
2021	236,035	898,598	520,782
2022	232,797		
2023	229,057		
2024	222,774		
	1,407,381	898,598	520,782

විභාගය පැවැත්වූ වර්ෂය හා අවස්ථාව	අදාළ වර්ෂය	වියදම රු.මිලියන
2019 -පළමු	2018	100
2023- දෙවන	2019–2022	220
2025-තෙවන	2024 - 2023	187
එකතුව		507

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) 2019-2024 කාලසීමාව තුල වර්ෂ 6ක් සඳහා අවස්ථා 3 කදී සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය (GIT) පවත්වා තිබුණු අතර එම විභාගය පැවැත්වූ අවස්ථා 3 තුලදී අ.පො.ස (උසස් පෙළ) විභාගයට පෙනී සිටි සිසුන්ගෙන් සියයට 36 ක් සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගයට (GIT) ඉල්ලුම් කර නොතිබුණි. එසේම, සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගයට (GIT) ඉල්ලුම් කල සිසුන්ගෙන් සියයට 42 ක් එම විභාගයට පැමිණ නොතිබුණි. ඒ අනුව සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය (GIT) පැවැත්වීමට රු.මිලියන 507 ක් වැය කලද අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) ඇගයීම් වියදම හැර විභාගය පැවැත්වූ අවස්ථා 3 හි විභාග වියදම රු.216,554,520 ක් වී තිබුණු අතර ඒ අනුව, විභාගයට අයදුම්කර පෙනී නොසිටින ලද 377,816 ක් වූ සිසුන් සඳහා රු. 91,050,461ක් නිෂ්කාර්යව වැයකර තිබුණි.

(ඇ) 2025 මාර්තු 15 දිනැති අංක 2/4/1/10/2025/1 දරන ලිපියෙන් සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය (GIT) 2025 වසරේදී අ.පො.ස (සා/පෙළ) විභාගය පැවැත්වෙන අතරතුර, පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බව විගණනයට දැණුම් දී තිබුණද 2026 පෙබරවාරි මාසයේ අ.පො.ස (සා/පෙළ) විභාගය ආරම්භ කර තිබුණද, ඒ අනුව සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය (GIT) පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2005 මාර්තු 07 දිනැති අංක ED/03/38/1/27/01(Sub) දරන අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව විභාග දෙපාර්තමේන්තුව විසින් සාමාන්‍ය තොරතුරු තාක්ෂණය විභාගය සමත්වන්නන්ට සහතිකයක් නිකුත් කරන බව සඳහන් වුවද, මෙම විභාගය සමත්වන්නන් සියලු දෙනාට සහතිකයක් නිකුත් කර නොතිබුණු අතර සහතිකයක් ඉල්ලුම් කරන සිසුන්ට පමණක් සහතික නිකුත් කර තිබුණි.

(ඉ) අ.පො.ස (උසස් පෙළ) විභාගයට සමගාමීව සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය (GIT) පැවැත්වීමට විභාග දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබීම හේතුවෙන් එම විභාගය පැවැත්වීමේ රජයේ වියදම්, ඊට සහභාගී වන නිලධාරීන්ගේ කාලය නිශ්කාර්යවීමක් මෙන්ම සිසුන්ගේ සහභාගිත්වය අඩුවීම තුළ විභාග සැලසුම් කිරීමේ ප්‍රමාණාත්මක අහිතකර තත්ත්වයක් තුළින් වැයකරන මුදලට වටිනාකමක් (VFM) ලබාගැනීමක් සිදුවී නොතිබුණි.

4.1.3.3 විමර්ශන පැවැත්වීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 - 2022 කාලසීමාව තුල අ.පො.ස. (සා/පෙළ) සහ අ.පො.ස. (උ/පෙළ) විභාග පවත්වන අවස්ථාවලදී, සිසුන් විභාග කොන්දේසි කඩකිරීම්වලට අදාළ වංචනික කටයුතු සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සඳහා ඉලෙක්ට්‍රොනික උපකරණ හා උපාංග 519 ක් ලබාගෙන තිබුණි. එම ක්‍රියා සම්බන්ධව විමර්ශන කටයුතු දීර්ඝ කාලයකට පෙර අවසන් වී තිබුණද විගණිත දිනය වූ 2025 නොවැම්බර් 20 දින වන විටත් එම ඉලෙක්ට්‍රොනික උපකරණ හා උපාංග අංශයේ අල්මාරිවල ගොඩගසා තිබුණු අතර ඒ සම්බන්ධව ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග හඳුනාගෙන නොතිබුණි.

(ආ) අ.පො.ස. (සා/පෙළ) 2024 (2025) විභාගයේ දී, විභාග මධ්‍යස්ථාන 04 ක ශාලා නිරීක්ෂක 06 දෙනෙකු විසින් විභාග පැවැත්වෙන අවස්ථාවේ ජංගම දුරකථන ලඟ තබාගැනීම හේතුවෙන් විමර්ශන ශාඛාවට භාරගත් එම ජංගම දුරකථන හිමි ශාලා නිරීක්ෂක 06 දෙනාට 2025 දෙසැම්බර් 29 දින වන විටත් ක්‍රියාමාර්ග ගැනීමක් සිදුකර නොතිබුණි.

(ඇ) අසාදු ලේඛනය පරීක්ෂා කිරීමේදී විභාග රාජකාරි තහනම් පනවන ලද නිලධාරීන් 461 ක් දෙනෙකුගෙන් 133 දෙනෙකුගේ ජාතික හැඳුනුම්පත් අංකයද, නිලධාරීන් 182 දෙනෙකුගේ වැඩ තහනම ආරම්භ කරන ලද දිනය ද අසාදු ලේඛනයෙහි ඇතුළත් කර නොතිබුණි. අසාදු ලේඛනගත කරන ලද නිලධාරීන්ගේ තොරතුරු විභාග රාජකාරිවලට පත්වීම් ලබාදීමේදී සලකා බැලීමක් සිදුකරන බව විගණනයට නිරීක්ෂණය නොවුණු අතර 2025 නොවැම්බර් 21 දිනැතිව වසර 07 කට වැඩි අසාදු ලේඛනගත කල නිලධාරීන්ගේ නම් අසාදු ලේඛනයෙන් ඉවත් කල බව 2026 ජුනි 05 දිනැතිව විගණකාධිපති වාර්තාවට ලබාදුන් පිළිතුර මගින් ඉදිරිපත් කල නමුත්, එසේ සිදුකිරීම ලේඛනය පවත්වා ගැනීමේ අඩුපාඩු හේතුවෙන් සිදුකර තිබුණු බව විගණනයට නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් අසාදු ලේඛනගත කළ නිලධාරීන් අඛණ්ඩවම විභාග රාජකාරිවල නියැලීම සිදු නොවුනේ යැයි විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

(ඇ) 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත ප්‍රකාරව විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරනු ලබන සහතිකයක් වෙනස් කිරීම සම්බන්ධයෙන් වරදකරු වන පුද්ගලයෙකුට එරෙහිව පනත මගින් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. එහෙත් 1989, 1993 හා 1996 වර්ෂවල සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි අයදුම්කරුවන් 05 දෙනෙකු ව්‍යාජ ප්‍රතිඵල සහතික සකස් කිරීමේ චෝදනාව මත වරදකරුවන් ලෙස 2024 වර්ෂයේදී ප්‍රතිඵල සනාථවන කටයුතු කිරීමේදී තහවුරු වී තිබුණ ද පනත ප්‍රකාරව ඔවුන්ට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව ඒ පිළිබඳව සිදු කළ නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

4.1.3.4 5 වසර ශිෂ්‍යත්ව විභාගය, අ.පො.ස (සා.පෙළ) හා අ.පො.ස (උ.පෙළ) යන ප්‍රධාන විභාග 3 හි විභාග ප්‍රතිඵල නිකුත් කල පසු එම ප්‍රතිඵල විශ්ලේෂණය කර වෙබ් අඩවිය තුල පලකිරීම විභාග දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණු නමුත්,එම විශ්ලේෂණය පදනම් කරගෙන හඳුනාගත හැකි ගැටළු සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂයය අධ්‍යක්ෂවරු පළාත් සහා, කලාප කාර්යාල ගුරු උපදේශකවරු යනාදි වශයෙන් වූ පාර්ශවයන් යටතේ එම ගැටළුවලට හේතුව හඳුනාගෙන ගතයුතු නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය මැදිහත්කරුවෙකු ලෙස විභාග දෙපාර්තමේන්තුව කටයුතු කිරීමක් සිදුකර නොතිබුණි.

තවද 2020 - 2024 කාලසීමාවේදී අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) විභාගයට අයදුම්කර විභාගයට පෙනී නොසිටින ලද සිසුන්ගේ සාමාන්‍ය ප්‍රතිශතය සියයට 10 ක් හා 17 ක් පමණ ප්‍රමාණාත්මක ඉහළ මට්ටමක පැවතුණු එක් කරුණක් සලකා බැලුවද ප්‍රතිඵල විශ්ලේෂණයට අනුව ප්‍රගතිය පිළිබඳව පසුවිපරමක් කර නොතිබුණි. ඒ අනුව විභාග ප්‍රතිඵල විශ්ලේෂණයට අදාලව මැදිහත්කරුවෙකු ලෙස ක්‍රියාකර ඒ අනුව සිදුවන සමාජමය හානිය අවම කරගැනීම මෙන්ම නිශ්කාර්ය වන මුද්‍රණ ද්‍රව්‍ය පිරිවැය වළකා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමක් සිදුකර තිබෙන බව විගණනයේදී නිරීක්ෂණය නොවුණි.

4.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) විභාග දෙපාර්තමේන්තුව තුළ තොරතුරු හා සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක නොකිරීම

පරිගණකගත තොරතුරු වත්කම්වල රහස්‍යභාවය, උපයෝජ්‍යතාව සහ විශ්වාසනීයත්වය සහතික කිරීම සඳහා ඒවා වෙත අනවසරයෙන් වන ප්‍රවේශවීම් වළක්වාලීම, වෙනස් කිරීම් හෝ විනාශ කිරීම් වලින් තොරතුරු වත්කම් ආරක්ෂා කිරීම සඳහා හඳුන්වා දී ඇති සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුගතව කටයුතු කළ යුතු බැවින් 2023 මැයි 02 දිනැති අංක MOT/2023/01 දරන තාක්ෂණ අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීම පිළිබඳ පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(I) පරිගණකගත තොරතුරු හා සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ ක්‍රියාකාරකම් සඳහා උපාය මාර්ගික උපදෙස් සැපයීමට ආයතනයේ තොරතුරු තාක්ෂණ කමිටුවක් සහ තොරතුරු තාක්ෂණ වත්කම් සම්බන්ධයෙන් වන අවදානම් හඳුනාගෙන ඒවා නිසි ඇගයීමට ලක්කිරීම සඳහා ආයතනය තුළ අවදානම් කළමණාකරණ කමිටුවක් පිහිටුවිය යුතු වුවද, 2026 අප්‍රේල් 30 දින වන විටත් එම කමිටුව පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

(II) තොරතුරු වත්කම් ආරක්ෂා කිරීම පිළිබඳ පහත කරුණු 2026 මැයි 20 දින වනවිටත් චක්‍රලේඛයේ සඳහන් පරිදි ඉටුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(i) ආයතනයේ තොරතුරු තාක්ෂණ ආරක්ෂාව සහතික කළයුතු ආකාරය විදහා දැක්වෙන තොරතුරු ආරක්ෂක ක්‍රියාකාරී සැලසුම් සකස් කර ඒවා ක්‍රියාත්මක කිරීම කළයුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් එලෙස කටයුතු කර නොතිබුණි.

(ii) ආයතනය සතු සියලුම වැදගත් තොරතුරු වත්කම් හා තොරතුරු තාක්ෂණ වත්කම් හඳුනාගෙන, තොරතුරු වත්කම් ලේඛනයක සටහන් කළ යුතු වුවත්, එසේ තොරතුරු වත්කම් ලේඛනයක් නඩත්තු කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) ගබඩා කිරීමට පෙර හෝ පරිගණක ජාල සහ වෙනත් වැනලයක් හරහා ගමන් කිරීමට පෙර සංවේදී තොරතුරු කේතනය කිරීමක් සිදුකර නොතිබුණි.

(iv) දෙපාර්තමේන්තුවේ පරිගණක මෙහෙයුම් පද්ධති නවතම සරීමා මඟින් යාවත්කාලීන කර නොමැති අතර සැපයුම්කරුවන් විසින් සපයන තීරණාත්මක සරීමා ස්ථාපනයට පෙර ඇගයීමකට ලක් කර නොතිබුණි.

(v) දෙපාර්තමේන්තුවේ විද්‍යුත් තැපැල හරහා සංවේදී තොරතුරු හුවමාරු කරන විට කේතන ක්‍රමවේදය භාවිතා නොකරන අතර විද්‍යුත් තැපැල් පෙරහන් ද සක්‍රීය කර නොතිබුණි.

(vi) තොරතුරු හා සයිබර් ආරක්ෂණය සම්බන්ධයෙන් කිසියම් සැකකටයුතු ක්‍රියාකාරකමක්, සම්බන්ධතාවයක්, සොකේට්ස් වෛරසය අවදානමක්, අනවසර ප්‍රවේශයක්, ලිපිගොනු විකෘති කිරීම හෝ සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියක උල්ලංඝනය කිරීමක් ආයතනයේ තොරතුරු නිලධාරියාට වාර්තා කරන ලෙස කාර්ය මණ්ඩලයට උපදෙස් ලබා දී නොතිබුණි.

(vii) ආරක්ෂණයට අහිතකර ලෙස බලපාන සිදුවීම්වලට ප්‍රතිචාර දැක්වීම සඳහා වන සැලැස්මක් සහ දෙපාර්තමේන්තුව සතුව ආපදා ප්‍රතිසාධන ක්‍රමවේදයක් නොමැති බව නිරීක්ෂණය විය.

(viii) දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරී වෙත තොරතුරු හා සයිබර් ආරක්ෂණ විගණන වගකීම් පවරා දී නොතිබුණු අතර සයිබර් ආරක්ෂණ විගණන වැඩසටහනක් ද නොමැති බව නිරීක්ෂණය විය.

(ix) තොරතුරු හා සයිබර් ආරක්ෂාව සම්බන්ධයෙන් වන වගකීම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්හට විධිමත්ව පැහැදිලි කර නොතිබුණි.

(x) රහසිගත තොරතුරු වත්කම් හෝ තීරණාත්මක ජාතික තොරතුරු යටිතල පහසුකම් සහිත පද්ධති සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරීන්ගේ පසුබිම් පරීක්ෂණ සහ ආරක්ෂණ නිශ්කාෂන සිදුකර නොතිබුණි.

(ආ) අධිකාරී බලයකින් තොරව සිදුකල නීත්‍යානුකූල නොවන ගනුදෙනු

දෙපාර්තමේන්තුවේ ලේඛන ප්‍රවාහනය සහ ඇගයීම් කටයුතු සඳහා දෙපාර්තමේන්තුවේ වාහන යොදා නොගෙන විභාග කටයුතු සඳහා විභාග දෙපාර්තමේන්තුවේ සුභසාධන සංගමයේ බස් රථ 02 ක් යොදාගෙන තිබුණු අවස්ථා 121 ක් විය. 2025 වර්ෂයේ දී යොදාගත් ගමන් වාර සංඛ්‍යාව පිළිවෙලින් 56 හා 65 ක් සඳහා රු. 12,113,581 ක් දෙපාර්තමේන්තුව විසින් නිත්‍යානුකූල පදනමකින් හා අධිකාරී බලයකින් තොරව සුභසාධක සංගමයට ගෙවා තිබුණි.

(ඇ) ගබඩා තොග කළමනාකරණය

(i) 2025 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2026 මැයි 25 දින වන විටද විගණකාධිපති වෙත ඉදිරිපත් නොකෙරුණි.

(ii) උප ගබඩා 02 ක් සහිත දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තොග ගබඩාව වර්ග අඩි 13,994 ක වපසරියක ස්ථාපිත කර සේවකයාන් 18 දෙනෙකු අනුයුක්ත කර වාර්ෂිකව ගබඩාවට විශාල තොග ප්‍රමාණයක් ලැබීම හා නිකුත් කිරීමක් සිදුවන නමුත් ගබඩාවේ තොග පාලනය කිරීම සඳහා පරිගණකගත තොග පාලන පද්ධතියක් හඳුන්වා දී නොතිබුණි. තවද මු.රෙ 762 ප්‍රකාරව තොග මට්ටම් තීරණය කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් පියවරයන් අනුගමනය කළ යුතු බවට දක්වා තිබුණ ද ඉතා වගකිව යුතු ලෙස අප්‍රමාදව කාලීනව ඉටුකල යුතු සංවිධානය කොට විභාග පැවැත්වීමේ කාර්යභාරයක් පැවරුණු විභාග දෙපාර්තමේන්තුවේ ගබඩාවල තොග මට්ටම් නිර්ණය කර නොතිබුණු අතර තොග නිකුත් කිරීමේ නිශ්චිත ක්‍රමවේදයක් ද හඳුන්වා දී නොතිබුණි.

(iii) දෙපාර්තමේන්තුවේ භාණ්ඩ සමීක්ෂණය සිදුකල අංශ 31 කින් අංශ 8 ක පවතින ස්ථාවර වත්කම් පිළිබඳව සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාව අනුව අංශ 8 ක පවතින ස්ථාවර වත්කම් අයිතමයන් 1,751ක් භාණ්ඩ සමීක්ෂණය වාර්තාවෙහි ඇතුළත් වුවද සිගාස් වත්කම් ලේඛනයේ එම ප්‍රමාණය ඇතුලත් වී නොතිබුණි. තවද ස්ථාවර වත්කම් පිළිබඳ නියැදි පරීක්ෂාවේ දී ස්ථාවර වත්කම් අයිතම 1,475 ක් සිගාස් වත්කම් ලේඛනයේ ඇතුළත් වුවද එම අයිතමයන් භාණ්ඩ සමීක්ෂණ වාර්තාවෙහි ඇතුළත්ව නොතිබුණි.

(iv) 2024 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව විභාග දෙපාර්තමේන්තුවේ අංශවල පරිගණක හා පරිගණක උපාංග අයිතම 58 ක ඌණතාවය, පොත්වල සටහන් තැබීමේ, භාණ්ඩ හුවමාරු වීමේ ,එකතුකිරීමේ යනාදී හේතු අනුව සිදු වී තිබුණු බවත් සත්‍ය ඌනතාවය ඒකක 04ක් බවත් වාර්තාවට ලබාදුන් පිළිතුරු මඟින් ඉදිරිපත් කලද එම කරුණු සම්බන්ධ කමිටු වාර්තාවක් ලබාදී නොතිබුණු අතර මුදල් රෙගුලාසි 103(4) පරීක්ෂණ ද පවත්වා නොතිබුණි.

4.3 පාඩු හා හානි

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) මුදල් රෙගුලාසි 762 අනුව ගබඩාව තුළ අවශ්‍ය තොග මට්ටම් මනාව පවත්වා ගැනීම පිළිබඳව සඳහන් වී තිබුණද දෙපාර්තමේන්තුවේ මුද්‍රණ යන්ත්‍ර හා අනෙකුත් යන්ත්‍ර භාවිතා කරනු ලබන තීන්ත අඩංගු ටෝන කාට්‍රිජ් තොග (Toner Cartridge) අයිතම වර්ග 78ක 2011 වර්ෂයට පෙර සිට පැවතෙන ඒකක 365 ක් සහිත ඒකක 427 ක් කල් ඉකුත් වී තිබුණු තොග ලෙස පැවතුණි.

(ආ) වටිනාකම රු. 383,337ක් වූ 215/80/R 16 වර්ගයේ ටයර් හයක් 2023 නොවැම්බර් 30 දින ප්‍රවාහන අංශයට නිකුත් කර ඇති නමුත් එම ටයර් අවශ්‍ය කරන ප්‍රමිතීන්ට අනුකූල නොවන බැවින් නැවතත් ප්‍රධාන ගබඩාව වෙත ලබා දී ඇති අතර එම ටයර් 06, 2023 වර්ෂයේ සිට ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණු නමුත් ඊට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අලාභය අයකිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1997, 1998, 2000 සහ 2004 වර්ෂයේදී මුද්‍රණය කළ විභාග අපේක්ෂකයින්ට විභාග ශාලාවේදී ලබාදෙන ලඝුගණක පොත්වල වැරදි සංඛ්‍යා ඇතුලත් වී තිබෙන බව 2024 උසස් පෙළ විභාගයේදී අනාවරණය වීමෙන් පසු ලඝුගණක පොත් 135,000 ක් 2025 මැයි 31 දින අපහරණය කර තිබුණි.

4.4 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන ලද විගණන විමසුම 24 ක් සඳහා අවම දින 55 ත් උපරිම දින 140 ත් අතර කාල පරාසයක් තුල ප්‍රමාද වී පිළිතුරු සපයා තිබුණි.

4.5 කළමනාකරණ දූර්වලතා

පහත කරුණු නිරීක්ෂණය විය.

4.5.1 විභාග දෙපාර්තමේන්තුව විසින් විභාග පනත ප්‍රකාරව සංවිධානය කොට විභාග පැවැත්වීම සඳහා විධිවිධාන පනවාගැනීම පරීක්ෂාව

(අ) විභාග රාජකාරි කටයුතුවල නියැලෙන නිලධාරීන්ගේ සම්බන්ධිත පාර්ශවයන් විධිමත්ව අර්ථ දක්වා නොතිබීම.

විභාග දෙපාර්තමේන්තුව විසින් බාහිරව හා අභ්‍යන්තරව විවිධ මට්ටම් යටතේ තනතුරු දරන සියලු නිලධාරීන් සහ සේවකයන් පාසල් හා ආයතනික විභාග රාජකාරි කටයුතුවලට යෙදවීමේදී එම නිලධාරීන්ගේ අදාළ විභාගවලට පෙනී සිටින සම්බන්ධිත පාර්ශවයන් පිලිබඳ තොරතුරු ලබාදීමට ආකෘතිපත්‍රයක් හඳුන්වා දී සම්බන්ධිත පාර්ශවයන් ලෙස කලත්‍රයා, දරුවන්, මුණුබුරු මිණිබිරියන්, සහෝදර සහෝදරියන්, කලත්‍රයාගේ සහෝදර සහෝදරියන්, තමන්ගේ හා කලත්‍රයාගේ සහෝදර සහෝදරියන්ගේ දරුවන්, තම නිවසේ නේවාසිකයන් නම්කර තිබුණු නමුත් 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ 22(2) (ඇ) ප්‍රකාරව පරීක්ෂකවරුන් පත්කිරීමේ කොන්දේසි යටතේ එම සම්බන්ධිත පාර්ශවයන් අර්ථ දැක්වීමට විභාග කොමසාරිස් ජනරාල්වරයා කටයුතු කර නොතිබුණි.

(ආ) රහස්‍යභාවය ආරක්ෂා කිරීම පිළිබඳ විභාග පනත ප්‍රකාරව විධිවිධාන පනවා නොගැනීම.

1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ 6(2) සිට 6(19) දක්වා වූ වගන්ති යටතේ පනවා ඇති විධිවිධාන නියමාකාරයෙන් පවත්වා ගැනීම සඳහා රහස්‍යභාවය හා විනිවිදභාවය ආරක්ෂා වන පරිදි, සංවිධානය කර පවත්වනු ලබන විභාග පැවැත්වීම හා ඒ ආශ්‍රිත විවිධ අදියරයන්හි විවිධ තනතුරු යටතේ පත්කරන කාර්යය මණ්ඩලය සම්බන්ධයෙන් රහස්‍යභාවය උපරිමයෙන් පවත්වා ගැනීම විභාග පනතට අනුකූලව සිදුකල යුතුය. එසේ නමුත් විභාග පනතේ 22(ඇ) ප්‍රකාරව පරීක්ෂකවරුන් පත්කිරීමේ ක්‍රමය සහ ඔවුන්ගේ යුතුකම් හා වේතන සහ පරීක්ෂකයින් පත්කිරීමේදී ඔවුන් යටත් විය හැකි මුදල් ගෙවීමේ හා වෙනත් කොන්දේසි නියෝග යටතේ පනවා ගෙන නොතිබුණි.

(ඇ) සම්බන්ධිත පාර්ශවයන් විභාග රාජකාරි කටයුතුවලින් ඉවත්කිරීමේ ක්‍රමවේදයේ දුර්වලතා.

(I) විභාග දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලය විසින් විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන යම් විභාගයක කාර්යයන් ආරම්භවීමට ප්‍රථම එම විභාගයට තමන් හෝ තම සම්බන්ධිත පාර්ශවයක අයකු පෙනී සිටීම පිළිබඳ දැනුම්දීම සඳහා ආකෘතිපත්‍රයක් හඳුන්වා දී තිබුණු අතර, දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලය ඒ ඒ අවස්ථාවලදී සම්බන්ධිත පාර්ශවයන් පිළිබඳ අනාවරණය කිරීම අනුව අදාල නිලධාරීන් ඒ ඒ විභාග රාජකාරි කටයුතුවලින් ඉවත් කිරීම සිදුකරනු ලබන බව විගණනයට විය. ඒ අනුව විභාග දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලය තම සම්බන්ධිත පාර්ශවයන් පිළිබඳ තොරතුරු හෙළිදරව් කරනු ඇතැයි යන විශ්වාසය මත පදනම්ව විභාග දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණු අතර විභාග දෙපාර්තමේන්තුව තුල ස්ථාපිත කරන දත්ත පද්ධතියක් තුලට අදාල නිලධාරීන්ගේ සම්බන්ධිත පාර්ශවයන් පිළිබඳ දත්ත ඇතුළු කර අවස්ථානුකූලව නිසි පරිදි යාවත්කාලීන කරමින් සම්බන්ධිත පාර්ශවයන් දෙපාර්තමේන්තුව තුල පවතින දත්ත මඟින්ම හඳුනාගැනීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් විභාග දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කර නොතිබුණි.

(II) තවද ආයතනික විභාග සම්බන්ධයෙන් සම්බන්ධිත පාර්ශවයන් හඳුනාගැනීම ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබුණු අතර, දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් එම විභාගවල බහුවරණ ප්‍රශ්නපත්‍ර ඇගයීම් කටයුතුවලට සම්බන්ධවී තිබුණි. එම තත්ත්වය එම විභාග පැවැත්වීමේ ස්වාධීනත්වය, රහස්‍යභාවයට හා විනිවිදභාවයට අහිතකර බලපෑමක් වී තිබුණි.

(III) දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන්ගේ හා සේවකයන්ගේ පවුලේ සාමාජිකයන් විභාගවලට පෙනී සිටීම පිළිබඳ නිලධාරීන් විසින් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වී වාර්තා කරන ලේඛනයක් ආයතන ශාඛාවේ නඩත්තු කර පවත්වාගෙන ගොස් තිබුණද එම ලේඛනයද එහි සඳහන් සියලු තීරුවල තොරතුරු ඇතුලත් වන පරිදි විධිමත්ව සහ යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

(IV) 2026 වර්ෂයේ පැවැත්වීමට නියමිත අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) විභාගයන්ට මුහුණ දෙන මුද්‍රණාලයේ සේවයේ නියුතු කාර්යමණ්ඩලයේ පෞද්ගලික ලිපිගොනු පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු පහත පරිදි වේ.

(i) විභාග ප්‍රශ්නපත්‍ර මුද්‍රණයේදී විශාල කාර්යභාරයක් ඉටුකරන රහස්‍ය මුද්‍රණාලයේ සේවයේ නියුතු නිලධාරීන් 38 දෙනෙකුගෙන් 9 දෙනෙකුගේම දරුවන් 2026 වර්ෂයේ පැවැත්වීමට නියමිත අ.පො.ස (සා.පෙළ) සහ අ.පො.ස (උ.පෙළ) විභාගවලට පෙනී සිටීමට නියමිත බව ඔවුන්ගේ පෞද්ගලික ලිපිගොනු

පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ නමුත් එම නිලධාරීන්ගේ සම්බන්ධිත පාර්ශවයන් පිළිබඳ තොරතුරු විභාග දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන විභාග රාජකාරිවලින් ඉවත් කිරීමේ කටයුතු සැලසුම් කිරීම 2026 ජනවාරි 31 දින වනවිටත් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) ඒ අනුව ඒ ඒ අංශවලට අනුයුක්ත කාර්යමණ්ඩල කල්වේලා ඇතිව හඳුනාගෙන ඒ සඳහා වෙනත් විකල්ප නිලධාරීන් හා සේවකයන් පත්කිරීමට විධිමත් ආයතනික හා පාසල් විභාග සැලසුම්වලට සමගාමීව වැඩපිළිවෙලක් සහිතව මානව සම්පත් සැලැස්මක් විභාග දෙපාර්තමේන්තුව තුළ පිළියෙල කර නොතිබුණි.

(iii) 2025 (2026) අ.පො.ස. (සා.පෙළ) විභාගය සඳහා, සම්බන්ධිත පාර්ශව පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන ලද මාණ්ඩලික නිලධාරීන් 15 දෙනෙකුගෙන් 06 දෙනෙකු ද අනෙකුත් නිලධාරීන් 39 දෙනෙකුගෙන් 18 දෙනෙකු ද දෙපාර්තමේන්තුව විභාග පවත්වන විට අනුගමනය කරන ක්‍රමයක් ලෙස විභාග පැවැත්වීමට මාස 02 කට පෙර විභාගයට ඉදිරිපත් වන තම සම්බන්ධිත පාර්ශවයන් පිළිබඳ තොරතුරු දැනුම් දී නොතිබුණි. ඒ අනුව මාස දෙකකට පෙර තොරතුරු දැනුම් නොදුන් ප්‍රතිශතය සියයට 44 ක් වී තිබුණි.

(iv) යම්කිසි පාසල් විභාගයක් හෝ ආයතනික විභාගයක් සඳහා ඉදිරිපත් වන දෙපාර්තමේන්තු නිලධාරීන් සහ ඔවුන්ගේ සම්බන්ධිත පාර්ශවයන් පිළිබඳ තොරතුරු එම විභාගය පැවැත්වීමට කොපමණ කාලයකට පෙර දෙපාර්තමේන්තුව වෙත දැනුම්දිය යුතුද යන්න පිළිබඳ නිශ්චිත කාලසීමාවක් සඳහන් කර ගැනීමද ප්‍රසිද්ධ විභාග පනතේ නියෝග යටතේ පනවා ගත යුතු කරුණක් නමුත් එසේ සිදුකර නොතිබුණි.

(ඇ) විභාග පනත ප්‍රකාරව උපදේශක කාරක සභා ස්ථාපිත නොකිරීම.

(i) 1972 වර්ෂයේදී පාසල් විභාග උපදේශක කාරක සභාව, කාර්මික විභාග උපදේශක කාරක සභාව, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය පිළිබඳ උපදේශක කාරක සභාව, අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය පිළිබඳ උපදේශක කාරක සභාව යන කාරක සභාවල සංයුතිය, බලතල, යුතුකම් හා කාර්යයන් විභාග පනත අනුව නියෝග මඟින් පනවා තිබුණද එම කාලසීමාවේදී හෝ එම කාරක සභා සඳහා සාමාජිකයන් පත්කර සක්‍රියව ක්‍රියාත්මක කළ බවට සාක්ෂි විගණනයේදී නිරීක්ෂණය නොවුණි. ඒ අනුව විභාග දෙපාර්තමේන්තුව විසින් පනතේ සඳහන් විභාග පිළිබඳ උපදේශක කාරක සභා ක්‍රියාත්මක කිරීමෙන් බැහැරව ආරම්භයේ සිටම විභාග සංවිධානය කොට පැවැත්වීම සිදුකර තිබුණු බව විගණනයට නිරීක්ෂණය විය.

(ii) විභාග දෙපාර්තමේන්තුව විසින් සංයුතිය, බලතල, යුතුකම් හා කාර්යයන් දක්වමින් උපදේශක කාරක සභා සඳහා 1972 වර්ෂයේදී පනවන ලද නියෝග බලාත්මක කර නොතිබුණි. ඒ අනුව 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ 22(2) වගන්තියේ සඳහන් කරුණු ආවරණය වන පරිදි පාසල් විභාග, ආයතනික හා අනෙකුත් විභාග සංවිධානය කොට පැවැත්වීමට අදාළව විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කර ගනිමින් ප්‍රසිද්ධ විභාග පැවැත්වීමට අදාළ නියෝග පනවාගෙන එම නියෝග සක්‍රියව බලාත්මක කිරීමට විභාග කොමසාරිස් ජනරාල්වරයා කටයුතු කර නොතිබුණි.

(iii) මේ ආකාරයට ප්‍රසිද්ධ විභාග සංවිධානය කර පැවැත්වීමට අදාළ විධිවිධාන නියෝග මඟින් ලිඛිතව ස්ථාපනය කර විධිමත්ව ක්‍රියාත්මක කිරීමට කටයුතු නොකිරීම මත විභාග පැවැත්වීමේ ක්‍රියාපටිපාටීන් වාචිකව නිලධාරීන්ගෙන් නිලධාරීන්ට හුවමාරුවන ක්‍රමවේදයන් අනුව විභාග දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වාගෙන ගොස් තිබීම හේතුවෙන් ජාතික තලයේ විභාග, ආයතනික විභාග හා අනෙකුත් විභාග සංවිධානය කොට පැවැත්වීමේ ක්‍රමවේදයන් තුළ පවතින රහස්‍යභාවය හා විනිවිදභාවය, නීත්‍යානුකූල ලියවිලි මත තහවුරු කිරීමට විභාග දෙපාර්තමේන්තුව අපොහොසත් වී ඇති බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඉ) පනත ප්‍රකාරව "පරීක්ෂක" යන සියලු පර්යායන් ආවරණය වන පරිදි නියෝග පනවාගෙන නොතිබීම.

යම් ප්‍රසිද්ධ විභාගයක් සම්බන්ධයෙන් "පරීක්ෂක" යන්නෙන් "ප්‍රශ්නපත්‍රයක් පිළියෙල කිරීම පිණිස පත්කරනු ලබන තැනැත්තන් හෝ උත්තර පත්‍රිකා කියවා බලා ඒවාට ලකුණු නියම කිරීම පිණිස පත්කරනු ලබන තැනැත්තෙක්" අදහස් වේ ලෙස 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ 23 වන වගන්තියේ සඳහන් වන බැවින් එම අර්ථ දැක්වීම අනුව විභාග කටයුතුවලට සම්බන්ධ වන සියලුම නිලධාරීන්ට "(පනත අනුව පරීක්ෂක)" හා පිළිතුරුපත්‍ර පරීක්ෂාවේ සිට විභාග ප්‍රතිඵල නිකුත් කිරීම දක්වා ක්‍රමවේදය හා පරිගණකගත කිරීම ආදී සියලු තත්ත්වයන්ද ආවරණය වන පරිදි අදාල කර ගනිමින් විවිධ තත්ත්වයක් යටතේ පවත්වාගත යුතු රහස්‍යභාවය ආරක්ෂා වන පරිදිත් නිරවද්‍යතාවයෙන්, කාලීනබවින් හා උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව විභාග පැවැත්වීමේ කාර්යසාධනය ඉහල නංවා ගැනීමට අවශ්‍ය නෛතික ප්‍රතිපාදන පනත ප්‍රකාරව පනවාගෙන නොතිබුණි.

(ඊ) නීත්‍යානුකූල තත්ත්වයක් නොපවතින කාර්ය පටිපාටි භාවිතා කිරීම

ප්‍රසිද්ධ විභාග පනතේ 22(1) (ඇ) ප්‍රකාරව විභාග සංවිධානය කර පැවැත්වීමට අවශ්‍ය විධිවිධාන පනවා ගත යුතු වුවත් එසේ කටයුතු නොකරමින් නීත්‍යානුකූල ලියවිල්ලක් ලෙස විභාග සංවිධානය කොට පැවැත්වීමට අදාළව 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත ප්‍රකාරව නියෝග සකස් කර ගැනීමකින් තොරව විභාග සංවිධානය කර පැවැත්වීමට අදාළ ක්‍රියාපටිපාටි "විභාග කාර්ය පටිපාටික රීති සංග්‍රහයක්" ලෙස සකස් කරගෙන විභාග දෙපාර්තමේන්තුව විසින් භාවිතා කර තිබුණ ද විභාග පනත ප්‍රකාරව ඊට අදාල නියෝග පනවාගෙන නොතිබීම හේතුවෙන් එම සංග්‍රහයට නීත්‍යානුකූල තත්ත්වයක් සලසාගෙන නොතිබුණි.

(උ) විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා ගත වන කාලය නිශ්චිතව තීරණය නොකිරීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) විභාග දෙපාර්තමේන්තුව විසින් වර්ෂ 74 ක කාලයක සිට විභාග පවත්වා ප්‍රතිඵල නිකුත් කිරීම සිදුකර තිබුණද අයදුම්කරුවන් සංඛ්‍යාව, විෂයයන් සංඛ්‍යාව යනාදී වශයෙන් වූ නිර්ණායක පදනම්ව ඒ ඒ විභාගයේ විභාග ප්‍රතිඵල නිකුත් කලයුතු තක්සේරු කරන ලද සම්මත (Standard) කාලයක් 2026 මැයි 15 දින දක්වා තීරණය කිරීමට විභාග දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. එබැවින් දෙපාර්තමේන්තුවේ කාර්යසාධන අරමුණු සපුරාගැනීමේ දී දෙපාර්තමේන්තුවේ සහ එහි සේවකයන්ගේ සාර්ථකත්වය ඇගයීම සඳහා භාවිතා කරන ප්‍රධාන කාර්යසාධන දර්ශකය (KPI) මැන බැලීමේ හැකියාවක් නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ii) 2024 ජනවාරි 01 දින සිට 2025 ඔක්තෝබර් 15 දින දක්වා කාලසීමාව තුලදී වෙනත් රාජ්‍ය ආයතන විසින් ඉල්ලීම් කරන ලද විභාග 168 ක් සලකා බැලීමේදී ආයතන විසින් විභාග පැවැත්වීමට විභාග දෙපාර්තමේන්තුවට ඉල්ලීම් යොමු කල දිනය හා එම විභාග, දෙපාර්තමේන්තුව විසින් එම විභාග පවත්වන ලද දිනය අතර අවමය මාස 03 සිට උපරිමය මාස 56 දක්වා කාල පරාසයක් තිබුණි.

4.5.3 මහජන නියෝජන පරීක්ෂාව

2024 (2025) අ.පො.ස. (සා/පෙළ) විභාගයේ උත්තරපත්‍ර පරීක්ෂක කටයුතු සඳහා බඳවාගැනීම් එම විභාගය ආරම්භ වන දිනට මාස තුනකට පමණ පෙර මාර්ගගත ක්‍රමයට අයදුම්පත් ඊට අදාල තෝරාගැනීම සිදුකර සියලුම පරීක්ෂකවරුන් වෙත තෝරාගත් බව හෝ ප්‍රතික්ෂේප වූ බව දැනුම්දීම කල යුතුය. මහනුවර විද්‍යාලයක ගුරුවරුන් 08 දෙනෙකුට ඇගයීම් කටයුතු ආරම්භ කිරීමට දිනකට පෙර ඇගයීම් අවස්ථාව නොලැබීම සම්බන්ධව දැනුවත් කර තිබුණි.

4.5.4 වාහන අනතුරු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) විගණනයට තොරතුරු කැඳවීමේදී 2025 වර්ෂයේදී වාහන අනතුරු 04 ක් සිදුවී ඇති බව සඳහන් කර තිබුණු නමුත් ලිපිගොනු පරීක්ෂාවේදී 2025, 2026 වර්ෂවල පිළිවෙලින් වාහන අනතුරු 09 ක් හා 07 ක් සිදුවී තිබුණි.

(ආ) විභාග කොමසාරිස් (පාලන හා විමර්ශන) වෙත වෙන්කර තිබුණු මෝටර් රථය 2025 මැයි 15 දින අනතුරකට ලක්වී තිබුණද රක්ෂණ සංස්ථාව නියමිත පරිදි දැනුවත් කර නොතිබීම හේතුවෙන් අළුත්වැඩියා වියදම වූ රු. 109,950 ක් ලබාදීම රක්ෂණ සංස්ථාව, ප්‍රතික්ෂේප කර තිබුණි. තවද වාහන අනතුර සම්බන්ධයෙන් මු.රෙ. 104 පරිදි වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

ඒ අනුව අනතුරු සිදුවී මාස 07 කට පසුව විභාග කොමසාරිස් (පාලන හා විමර්ශන) ට වෙන්කල වාහනයට සිදුවූ අනතුර පිළිබඳව පරීක්ෂාව සිදුකිරීමට එම නිලධාරිනිය යටතේම සිටින නිලධාරීන්ගෙන් යුක්ත කමිටුවක් පත් කර තිබුණි. 2026 මැයි 30 දිනට අනතුරු සිදුවී මාස 12 ක් ගතවුවත් එම කමිටු විසින් ද 104 (4) පරීක්ෂණ වාර්තා විගණකාධිපතිට ඉදිරිපත් නොකෙරුණු අතර රජයට සිදුවී තිබුණු රු. 109,950ක් වූ පාඩුව වගකිවයුතු පාර්ශවයෙන් අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඇ) 2025 සැප්තැම්බර් 19 දින අනතුරට ලක් වී තිබුණු වෑන් රථය අලුත්වැඩියා සඳහා රු. 73,791 ක් වැයකර තිබුණු නමුත් 2026 මැයි 30 දිනවනවිටත් මුදල් රෙගුලාසි 104 ප්‍රකාර ප්‍රාරම්භක හා අවසන් පරීක්ෂණ සිදුකර එම වාර්තා විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි.

4.5.5 ඩිජිටල් මුද්‍රණ යන්ත්‍ර භාවිතයේ කාර්යසාධනය

ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) විභාග දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලය, නව තාක්ෂණය අනුව වැඩිදියුණු කිරීම මැයෙන් යුතුව අංක 2016/ED/E/32 දරන හා 2016 ඔක්තෝබර් 14 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලය සඳහා ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය යොදාගැනීම සඳහා නව තාක්ෂණික මුද්‍රණ යන්ත්‍ර හා ආශ්‍රිත උපකරණ මිලටගැනීම සඳහා අනුමැතිය හා ඒ සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කර තිබුණු අතර අනුමැතිය 2016 සැප්තැම්බර් 16 දිනැතිව ලැබී තිබුණි. අමාත්‍ය මණ්ඩල සංදේශය තුල දෙපාර්තමේන්තුව විසින් ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය යොදාගැනීම තුලින් ඇතිවන වාසිදායක තත්ත්වයන් පහත පරිදි සාධාරණීකරණය කර තිබුණි.

(i) ඩිජිටල් මුද්‍රණ යන්ත්‍රවල ගුණාත්මක මුද්‍රණ හැකියාව මත ප්‍රශ්නපත්‍රවල මනා නිමාවක් ලබාගැනීමට හැකිවීම.

(ii) රහස්‍ය සාම්ප්‍රදායික මුද්‍රණාලය තුළ දැනට භාවිතා වන මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම හා අවසන් කිරීමේ පියවරයන් සඳහා සේවකයන් 50 කට ආසන්න පිරිසක් යොදාගැනීමට සිදුවීම මත රහස්‍යභාවය ආරක්ෂා කර ගැනීමට වැඩි කාලයක් හා පිරිවැයක් දැරීමට සිදුවන බැවින් නව තාක්ෂණය යොදාගැනීම තුලින් එම තත්ත්වය අවම වීම .

(iii) ප්‍රශ්නපත්‍ර භාරව සිටින මාණ්ඩලික නිලධාරීන් උපරිම වශයෙන් 03 දෙනෙකු මගින් ඩිජිටල් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබෙන නිසා විභාගවල රහස්‍යභාවය උපරිමයෙන් ආරක්ෂා කරගැනීම ඉතා සාර්ථක මට්ටමකට ගෙන ඒමට හැකිවීම.

(ආ) 2014 වර්ෂයේදී රු. මිලියන 38 කට මිලදීගෙන තිබුණු ඩිජිටල් මුද්‍රණ යන්ත්‍ර 02 ට අමතරව 2016 හා 2018 වර්ෂයන්හි තවත් ඩිජිටල් යන්ත්‍ර 02 ක් පිළිවෙලින් රු. මිලියන 82 ක් හා රු. මිලියන 546 ක් වැයකර මිලදීගෙන තිබුණි. ප්‍රශ්නපත්‍ර මුද්‍රණය ඉතා රහස්‍යභාවයකින් යුතුව මුද්‍රණය කිරීමේ අවශ්‍යතාවය පෙන්නුම් කර, ඩිජිටල් මුද්රණ යන්ත්‍ර මිලදීගැනීමේ අවශ්‍යතාවයත් ,පැරණි මුද්‍රණ යන්ත්‍ර භාවිතය අවාසිදායක බවත් අමාත්‍ය මණ්ඩල සංදේශය තුලින් පෙන්වා දී තිබුණද ඩිජිටල් මුද්‍රණ යන්ත්‍රවල කාර්යසාධනය පිලිබඳව සිදුකල පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මුද්‍රණ යන්ත්‍ර 04 ක් ඩිජිටල් රහස්‍ය මුද්‍රණාලය තුල ස්ථාපිත කර තිබුණු අතර එම මුද්‍රණ යන්ත්‍රවලින් මුද්‍රණය කරන ලද පිටපත් සංඛ්‍යාව වෙන් වෙන්ව හඳුනාගත හැකි පරිදි මුද්‍රණ යන්ත්‍ර ධාවන සටහන් පොත් නඩත්තු කර නොතිබුණු අතර මුද්‍රණ යන්ත්‍ර 04 සඳහාම එක් ලේඛනයක් නඩත්තු කර තිබුණු අතර මුද්‍රිත පිටපත් සංඛ්‍යාව පොදුවේ සටහන් කර තිබුණි.

(ii) වටිනාකම රු.මිලියන 546 ක වියදමක් දරා අඩු සේවක සංඛ්‍යාවක් යොදා ගනිමින් ඉහළ නිෂ්පාදන ධාරිතාවයක් කෙටි කාලයකින් ලබාගැනීමටත් උසස් නිමැවුමක් සහිතව රහස්‍යභාවය විශ්වාසනීයත්වය උපරිම මට්ටමින් ආරක්ෂා කර ගනිමින් ප්‍රශ්නපත්‍ර මුද්‍රණය හා ඇසුරුම් කිරීමත් අරමුණු කරගෙන මිලදීගෙන තිබුණු වයිඩ් වෙබ් ඩිජිටල් මුද්‍රණ යන්ත්‍රයෙන් (Wide Web

Digital Printing) 2020-2024 කාලසීමාවේ වර්ෂ 05 ක් තුලදී දෙපාර්තමේන්තුව විසින් අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) ප්‍රශ්නපත්‍ර මුද්‍රණය කිරීම පිළිබඳ දත්ත විශ්ලේෂණය කිරීමේදී වයිඩ් වෙබ් ඩිජිටල් මුද්‍රණ යන්ත්‍රය මගින් අවමය සියයට 03 සිට උපරිමය සියයට 28 දක්වා පරාසයක් තුලද ඩිජිටල් මුද්‍රණ යන්ත්‍ර 03 මගින් අවමය සියයට 02 සිට උපරිමය සියයට 15 දක්වා පරාසයක් තුලද මුද්‍රණය කර තිබුණු අතර සාම්ප්‍රදායික මුද්‍රණ යන්ත්‍ර භාවිතයෙන් අවමය සියයට 69 සිට උපරිමය සියයට 90 ක් දක්වා පරාසයක් තුලද ප්‍රශ්නපත්‍ර මුද්‍රණය සිදුකර තිබුණි.

(iii) ඒ අනුව ඩිජිටල් මුද්‍රණ යන්ත්‍ර මිලදීගැනීමේදී පෙන්වා දී තිබුණු අරමුණට අනුව එම ඩිජිටල් මුද්‍රණ යන්ත්‍ර භාවිතා කිරීමේ කාර්යසාධනය ඉතා පහල මට්ටමකින් පැවතුණි. ඒ අනුව ඩිජිටල් මුද්‍රණ යන්ත්‍ර භාවිතය තුලින් ලගාකර ගැනීමට අපේක්ෂිත ප්‍රශ්නපත්‍රවල නිමාව, රහස්‍යභාවය උපරිමයෙන් ආරක්ෂා කිරීමේ අවධානම අඩුවීම, පිරිවැය හා කාලය අවමවීම යන තත්ත්වයන් එම යන්ත්‍ර මිලදීගැනීම අරමුණුගතව ඉටුවී නොතිබුණි.

වී.ඩී. සීතා

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

6. ආයතනයේ කාර්ය සාධන දර්ශක
(ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100% - 90%	**89% - 75%**	**74% - 50%**	**49% - 0%**
ජාතික මට්ටමේ පාසල් විභාග සංවිධානය හා පැවැත්වීම {5 ශ්‍රේණිය ශිෂ්‍යත්වය, අ.පො.ස. (සා.පෙළ), අ.පො.ස. (උ.පෙළ)}	100%			
ආයතනික විභාග පැවැත්වීම	100% *			
සහතිකපත්‍ර නිකුත් කිරීම	100%			

* විභාග පැවැත්වීම සඳහා බාහිර ආයතනවලින් 50% කට වඩා ගෙවීම් කරන ලද සෑම විභාගයක්ම පවත්වා ඇත. ඊට අමතරව අධ්‍යාපන අමාත්‍යාංශය හා විභාග දෙපාර්තමේන්තුවට අදාළ විභාග ද පවත්වා ඇත.

7. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

7.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

අරමුණ	ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50 %-74%	75%-100%
SDG - 4 ගුණාත්මක අධ්‍යාපනය	5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය, අ.පො.ස. (උසස් පෙළ), අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සහ සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය යන විභාග පොදු කාලසටහනක් යටතේ දිවයින පුරා එකම වේලාවක පැවැත්වීම සහ ඒ සඳහා සියලු අපේක්ෂකයන්ට සමාන ප්‍රවේශ අවස්ථා ලබාදීම	එම විභාග සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව			✓
	විශේෂ අවශ්‍යතා ඇති සිසුන්ගේ ආබාධ සහ දුර්වලතා සම්මුඛ පරීක්ෂණයක් මගින් හඳුනාගෙන ඔවුන් විභාගයට පෙනී සිටීමේ දී සහන ලබා දීම උදා :- 1. ඔවුන් භාවිතා කරන හුරුපුරුදු උපකරණ, විශේෂ රෝද පුටු, විභාග කාර්යමණ්ඩලය අවශ්‍යතාව අනුව යොදවා ගැනීමට ඉඩ දීම 2. වැඩිපුර කාලය ලබාදීම 3. විශේෂිත විභාග පරිපාලන ක්‍රම	සහන ලබාගත් අයදුම්කරුවන් සංඛ්‍යාව			✓
	ස්ත්‍රී/පුරුෂ භාවය අනුව, ආගම් අනුව, සංස්කෘතීන් අනුව ප්‍රශ්න පත්‍රයක අයිතම නැඹුරු වීම අවම කිරීම	ප්‍රශ්න පත්‍රවල සැමට සාධාරණභාවය			✓

අරමුණ	ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
SDG - 4 ගුණාත්මක අධ්‍යාපනය	දත්ත විශ්ලේෂණ මගින් විභාග අපේක්ෂකයන් දුර්වලතා දක්වන ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ ගුරු උපදේශකවරුන් / විෂය නිලධාරීන්ට තම අධ්‍යාපන කොට්ඨාසවල විෂය සංවර්ධන ව්‍යාපෘති හඳුනා ගැනීමට උපකාර කිරීම	සෑම ජාතික විභාගයකම ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු දත්ත විශ්ලේෂණය කොට වාර්තා වෙබ් අඩවියෙහි පළ කිරීම			✓
	අ.පො.ස. (සාමාන්‍ය පෙළ) හා අ.පො.ස. (උසස් පෙළ) විභාගවල තෝරාගත් විෂයයන් සඳහා ශිෂ්‍ය සාධන දත්ත සහ සාර්ථකව ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු ඇතුළත් ඇගයීම් වාර්තා දිවයිනේ අදාළ පාසල් සඳහා ලබාදීමෙන් සියලු සිසුන්ට ප්‍රවේශ වීමට පහසුකම් සැලසීම	අ.පො.ස. (සාමාන්‍ය පෙළ) හා අ.පො.ස. (උසස් පෙළ) විභාගවල ප්‍රධාන විෂයන්වලට අදාළව නිමවන ලද ඇගයීම් වාර්තා		✓	
	ප්‍රශ්න පත්‍රවල අයිතම විශ්ලේෂණය සහ සිසුන්ගේ සාධනය පිළිබඳ තොරතුරු ඇතුළත් සියලුම විෂයන්ගේ සමපාලක පරීක්ෂකවරුන් සඳහා ලබාදෙන පොත් හරහා විභාග අපේක්ෂක සෑමට සාධාරණ ප්‍රශ්න පත්‍රයක් ලබාදීමට පහසුකම් සැලසීම	සෑම විෂයකම තොරතුරු ඇතුළත් CCM පොත්		✓	

7.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ජයග්‍රහණ:

- 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය 2025, අ.පො.ස. (උසස් පෙළ) 2025 (2026) සහ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) 2025 (2026) විභාගවල රහස්‍යභාවය උපරිම ආරක්ෂා කරමින් පොදු කාලසටහනක් යටතේ දිවයින පුරා එකම වේලාවක පැවැත්වූ අතර ඒ සඳහා සියලු අපේක්ෂකයන්ට සමාන ප්‍රවේශ අවස්ථා ලබා දෙන ලදී.

- 2025 වර්ෂයේ දී පැවැත්වූ සියලුම ජාතික මට්ටමේ විභාග පැවැත්වීමට පෙර විශේෂ අවශ්‍යතා ඇති සිසුන්ගේ ආබාධ සහ දුර්වලතා සම්මුඛ පරීක්ෂණයක් මගින් හඳුනාගෙන ඔවුන්ට විභාගයට පෙනී සිටීමේ දී අවශ්‍ය සහන ලබා දෙන ලදී.

- ඇගයීම් වාර්තා සියලු පාසල්වලට ලබාදීම හා වෙබ් අඩවියට ඇතුළත් කිරීම මගින් දුෂ්කර ප්‍රදේශවල සිට විභාගයට ඉදිරිපත් වන සිසුන්ට ද විභාගය පිළිබඳ තොරතුරු හා උපදෙස් සන්නිවේදනය කිරීම, ගුරුවරුන්ට නිසි උපදෙස් ඒ හරහා ලබාදීම හා අධ්‍යාපන සංවර්ධනය පිළිබඳ කටයුතු කරන නිලධාරීන්ට සිසුන්ගේ දුර්වලතා පිළිබඳ තක්සේරුවක් ලබාදීම.

- එක් එක් ජාතික විභාග ආසන්නයේ දී විභාග අපේක්ෂකයන්, ගුරුවරුන්, දෙමව්පියන් දැනුවත් කිරීම සඳහා රූපවාහිනී හා ගුවන්විදුලි මාධ්‍ය භාවිතයෙන් පැවැත්වෙන දැනුවත් කිරීමේ සාකච්ඡා.

අභියෝග:

- විභාගය මූලික කරගත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හේතුවෙන් ඉගෙනුම සඳහා තක්සේරුකරණ ක්‍රියාවලිය පන්ති කාමර තුළ සිදු නොවීම තුළ නිපුණතා මට්ටමට ළඟා නොවූ සිසුන් පාසලෙන් පිටවීම.

8. මානව සම්පත් පැතිකඩ

8.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	90	75	15
තෘතීයික	26	13	13
ද්විතියික	488	393	95
ප්‍රාථමික	206	ස්ථිර - 105 අනියම් -56	45

8.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය

උක්ත 6.1 හි සඳහන් පරිදි මානව සම්පත් හිඟයක් පැවතියද දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනයට බලපෑමක් නොවන අයුරින් දැනට පවතින මානව සම්පත දෙපාර්තමේන්තු රාජකාරි සඳහා යොදවා ගැනීමට දෙපාර්තමේන්තු පරිපාලනය සමත් ව ඇත. එමෙන්ම, දැනට දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීම තුලින් පවත්නා තත්ත්වයට වඩා උසස් වූ කාර්ය සාධන මට්ටමක් පෙන්නුම් කිරීමට හැකියාව ලැබී ඇත.

8.3 මානව සම්පත් සංවර්ධනය

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
01	Book Binding & Finishing	01	මාස 06	40,500.00		දේශීය	පොත් බැඳුම්කරණය සහ නිමාව පිළිබඳ මුද්‍රණ සේවයේ සහ කා.සේ.සේ. හවතුන්
02	මුද්‍රණ සේවයේ කාර්යක්ෂමතා කඩඉම් පැවැත්වීම සඳහා මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහය පුහුණු වැඩමුළුව	17	පැය 60	42,000.00		දේශීය	මුද්‍රණ සේවයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අදාළව මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහය පිළිබඳ දැනුම වර්ධනය කිරීම
03	ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග ක්‍රියාවලිය ප්‍රමිතිගතකරණය ආරම්භක දින වැඩමුළුව	23	පැය 03	5,400.00		දේශීය	ජාතික මට්ටමේ විභාග ක්‍රියාවලිය ප්‍රමිතිගතකරණය සඳහා ප්‍රවේශයක් ලබා ගැනීම පිළිබඳ නිලධාරීන් දැනුම්වත් කිරීම
04	විශ්‍රාම වැටුප් සකස් කිරීම සම්බන්ධ පුහුණු වැඩමුළුව	34	දින 02	63,550.00		දේශීය	විශ්‍රාම වැටුප් සකස් කිරීම සහ එම කාර්යයේදී සිදුවන ගැටළුකාරී අවස්ථා පිළිබඳ විෂය නිලධාරීන් සහ එම කාර්යයට සම්බන්ධ වන නිලධාරීන් දැනුම්වත් කිරීම
05	Advanced office Application & Google work Space Tools පාඨමාලාව	40	දින 06	765,000.00		දේශීය	**Advanced office Application & Google work Space Tools,** විෂය රාජකාරි හා බැඳිව කටයුතු සිදු කර ගතහැකි ආකාරය පිළිබඳව නිලධාරීන් දැනුම්වත් කිරීම
06	Digital Empowerment for Administrative Excellence	35	දින 06	490,000.00		දේශීය	කෘතිම බුද්ධිය සහ වෙනත් ඩිජිටල් මෙවලම් භාවිත කරමින් විභාග ක්‍රියාවලියට අදාළ කාර්යයන් කාර්යක්ෂම කිරීම පිළිබඳ මාණ්ඩලික නිලධරීන් පුහුණු කිරීම

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
07	රාජ්‍ය වත්කම් කළමනාකරණය	06	දින 01	75,000.00		දේශීය	රාජ්‍ය වත්කම් කළමනාකරණය පිළිබඳ නිලධාරීන් දැනුම්වත් කිරීම
08	විනයානුකූල හා ආරක්ෂිත රිය පැදවීම	07	දින 01	42,000.00		දේශීය	විනයානුකූල සහ ආරක්ෂාකාරී රිය පැදවීම තුළින් අනතුරු අවම කර ගැනීමට කටයුතු කරනා ආකාරය පිළිබඳ රියදුරන්ගේ දැනුම සහ ආකල්ප වර්ධනය කිරීම
09	විභාග ක්‍රියාවලිය ප්‍රමිතිගතකරණය	80	දින 02	245,333.00		දේශීය	**SLS** ප්‍රමිති අනුකූලව විභාග ක්‍රියාවලිය ප්‍රමිතිගතකරණය සිදු කරගෙන පවත්වාගෙන යාම
10	විමර්ශන නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම	20	දින 02	200,000.00		දේශීය	විභාග දෙපාර්තමේන්තුවට අදාළව විභාග ක්‍රියාවලියේ දී සිදු වන විමර්ශන කටයුතු විධිමත්ව සිදු කිරීම
11	කාර්ය මණ්ඩල ධාරිතා සංවර්ධන වැඩසටහන (පාසල් විභාග ඇගයීම්/සංවිධාන)	50	දින 02	266,000.00		දේශීය	කාර්ය මණ්ඩල ධාරිතා සංවර්ධනය මඟින් විභාග පැවැත්වීමේ සමස්ථ ක්‍රියාවලිය කාර්යක්ෂම සහ සඵලදායීව සිදු කිරීම
12	AS 400 පරිගණක පද්ධතිය යාවත්කාලීන කිරීමට අදාල පුහුණුව	10	දින 02	1,660,945.00		දේශීය	**AS 400** පරිගණක පද්ධතිය නියමාකාරයෙන් හසුරුවමින් යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා නිලධාරීන් පුහුණු කිරීම

9. අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පැවරීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ	පිළිතුරු ප්‍රමාද වීම් ද ඇත	
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	සෑම වාර්තාවකටම මාසයක් තුළ පිළිතුරු ලැබී නොමැත	සෑම වාර්තාවකටම වාර්තාව ලැබුණ දින සිට දින 14 ක් තුළ පිළිතුරු සැපයීම කළ යුතු බව දන්වා යවා ඇත.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	ණය අය කිරීමට අදාල කටයුතු සිදු කරමින් පවතී.	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	අදාල කටයුතු අවසන් කිරීමෙන් පසු නිරවුල් කිරීමට නිලධාරීන් දැනුවත් කර ඇත.	
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	2025 වාර්තාව 2026.05.22 දින තොරතුරු කොමිෂන් සභාව වෙත යැවීමට කටයුතු කර ඇත.	
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ	පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.	
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	පුහුණු අවශ්‍යතාවල පවතින ප්‍රමුඛතාව, පුහුණු අවශ්‍යතා සඳහා ඉදිරිපත් කරන ඉල්ලීම් හා පැවති සීමිත ප්‍රතිපාදන මත පදනම්ව සමස්ත කාර්ය මණ්ඩලයේ බොහෝ තනතුරු ආවරණය වන පරිදි 2025 වර්ෂයේ දී පුහුණු අවස්ථා ලබා දෙන ලදී. (මාණ්ඩලික නිලධාරී, සංවර්ධන නිලධාරී කළමනාකරණ සේවා නිලධාරී, මුද්‍රණ සේවයේ නිලධාරීන්) තවද, මෙම දෙපාර්තමේන්තුව වර්ෂය පුරාම ජාතික මට්ටමේ විභාග හා ආයතනික විභාග රාශියක් පවත්වනු ලබයි. එබැවින් වර්ෂය පුරාම නිලධාරීන් අධික ලෙස කාර්යබහුල වේ. එවැනි තත්ත්වයක් තුළ සෑම නිලධාරියෙකු සඳහාම අවම පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථා ලබාදීමට ප්‍රායෝගිකව ඉඩ සැලසෙන්නේ නැත.	අනෙකුත් ඉතිරිව පවතින පුහුණු අවශ්‍යතා සැලකිල්ලට ගෙන 2026 වර්ෂයේ සහ ඉදිරි වර්ෂවල දී තවත් නිලධාරීන් සඳහා පුහුණු වීම් ලබා දීමට සැලසුම් කර ඇත.
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		